

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2023

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

மனிதவலு மற்றும் வேலைவாய்ப்புத் திணைக்களம்

DEPARTMENT OF MANPOWER & EMPLOYMENT

2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

2023

වැය ශීර්ෂ අංකය - 328

පටුන

පිටු අංකය

01.	**පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය**	**5**
	1.1 හැඳින්වීම	6
	1.2 දැක්ම, මෙහෙවර හා අරමුණු	6
	1.3 සංවිධාන සටහන	7
	1.4 කාර්ය මණ්ඩල තොරතුරු	8
	1.5 දෙපාර්තමේන්තුවේ අංශ	10
	1.6 දෙපාර්තමේන්තුවේ අංශයන්හි කාර්යභාරය	13
02.	**පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම**	**17**
	2.1 ප්‍රගතිය	18
	2.2 අභියෝග හා ඉදිරි ඉලක්ක	28
	2.3 භෞතික හා මූල්‍ය ප්‍රගති සාරාංශය - 2023.12.31 දිනට	31
03.	**පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය**	**35**
	3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය	36
	3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය	38
	3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	40
	3.4 ආදායම් එකතුකිරීමේ කාර්ය සාධනය	42
	3.5 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය	42
	3.6 මු.රේ.208 ප්‍රකාරව ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	42
	3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	43
	3.8 විගණන වාර්තාව	44
4.	**පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක**	**51**
	4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක	52
5.	**පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු සපුරාගැනීමේ කාර්යසාධනය**	**53**
	5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු	54
	5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	54
6.	**පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ**	**57**
	6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය	58
	6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟයේ බලපෑම	58
	6.3 මානව සම්පත් සංවර්ධනය	58
7.	**පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව**	**61**

01

පරිච්ඡේදය

ආයතනික පැතිකඩ/
ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1. හැඳින්වීම

මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

රටක මිනිස්බලය හෙවත් මානව සම්පත එහි සංවර්ධනය හා ප්‍රගතිය කෙරෙහි තීරණාත්මක බලපෑමක් ඇති කරයි. ආර්ථික සංවර්ධනය, නවෝත්පාදනය හා නිර්මාණශීලීත්වය, ශ්‍රම බලකායේ ඵලදායීතාවය, ගෝලීය තරඟකාරීත්වය, සමාජ ස්ථාවරත්වය, සෞඛ්‍ය හා යහපැවැත්ම, ජනවිකාශ ලාභාංශ, සමාජ ප්‍රගතිය, තාක්ෂණික වෙනස්කම්වලට අනුවර්තනය වීම සහ මානව ප්‍රාග්ධනය ගොඩනැගීම යන ප්‍රධාන සංවර්ධන කාරකයන්හි ධනාත්මක වර්ධනය හා හැසිරීම සඳහා ජාතියක මානව සම්පතෙහි බලපෑම අතිමහත්ය. රටක සංවර්ධනය හා උක්ත සංවර්ධන කාරක අතර අනුලෝම සම්බන්ධය ගොඩනැගෙන්නේ මානව සම්පත්හි කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය මඟිනි. ගෝලීය හා දේශීය ශ්‍රම වෙළඳපොළ ප්‍රවණතා හඳුනාගනිමින් ශ්‍රී ලංකාවේ මානව සම්පත ශ්‍රම වෙළඳපොළ හා ගැලපීම අරමුණු කරගනිමින් මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත. එහි ප්‍රධාන පරමාර්ථය වන ශ්‍රම වෙළඳපොළ හා ශ්‍රම බලකාය අතර ගැලපීම සඳහා 2010.01.01 දින සිට මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ.

1.1. ප්‍රධාන කාර්යයන්

1. වෘත්තීය මාර්ගෝපදේශ සේවා සැපයීම
2. ශ්‍රම වෙළඳපොළ තොරතුරු එක් රැස් කිරීම, විශ්ලේෂණය හා බෙදා හැරීම
3. මහජන රැකියා සේවා ලබාදීම
4. ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනගා ගැනීම
5. මානව සම්පත් සංවර්ධනයට අදාල කටයුතු ඉටු කිරීම

1.2. දැක්ම, මෙහෙවර හා අරමුණු

දැක්ම

වෙනස්වන වැඩ ලෝකයේ අපගේ සේවාලාභීන්හට ජයග්‍රහණය කිරීමට අවශ්‍ය වන පරිදි නව ශ්‍රම බලකා විසඳුම් හා සේවාවන් නිර්මාණය කිරීම සහ හුවමාරු කිරීම සඳහා නායකත්වය ලබාදීම.


මෙහෙවර

සේවායෝජකයින්ගේ තෘප්තිය වෙත අවධානය යොමු කරමින්, ගුණාත්මක වැඩ ආචාරධර්ම සංස්කෘතියක් සනාථ කරමින්, ඵලදායී මානව ප්‍රාග්ධනයක් වර්ධනය කිරීමත්, සේවායෝජකයින්ගේ තෘප්තිය, නිර්මාණාත්මක අගය සහතික කරමින් තරඟකාරී වාසිය සඳහා මානව ප්‍රාග්ධනය දියුණු කිරීම සහ හැඩගන්වමින් නායකත්වය ලබාදීම.

අරමුණු

- 2025 වර්ෂය වන විට පිරිමි ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය 70% සිට 73% දක්වාද, කාන්තා ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය 32% සිට 34.5% දක්වාද, 2030 දී පිරිමි ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය 75% දක්වාද, කාන්තා ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය 45% දක්වා වැඩි වීම.
- පුහුණු/ වෘත්තීමය ශ්‍රමිකයන් විදෙස් ගත වීමේ ප්‍රතිශතය 2030 වන විට දෙගුණයක් බවට පත් කිරීම (36.5% සිට 73%) හා විදෙස් ගතවන නුපුහුණු ශ්‍රමිකයන්ගේ ප්‍රතිශතය අඩු වීම.
- 2025 වන විට EDBI දර්ශකයෙහි ශ්‍රී ලංකාව රැඳී සිටින ස්ථානය 99 සිට 89 දක්වා ඉහළ නැංවීම සඳහා ප්‍රතිපත්තිමය සංවාදයක් ඇති වීම.
- 2030 වන විට දේශීය හා ගෝලීය ඉල්ලුම සපුරාලීම සඳහා කාර්යක්ෂම හා සදාචාරාත්මක ශ්‍රම බලකායක් ඇති කිරීම සඳහා ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශයක් ලබා දීම.

1.3 සංවිධාන සටහන


අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී.ල.ම.සේ (විශේෂ)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
(විශේෂ ශ්‍රී.ල.ම.සේ)
අධ්‍යක්ෂ (පාලන) (D1)
ශ්‍රී.ල.ම.සේ I ශ්‍රේණිය
අධ්‍යක්ෂ (සැලසුම් හා පරිශ්‍රණ) (D2)
ශ්‍රී.ල.ම.සේ I ශ්‍රේණිය
අධ්‍යක්ෂ (මානව සම්පත් කළමනාකරණ) (D3)
ශ්‍රී.ල.ම.සේ I ශ්‍රේණිය
අධ්‍යක්ෂ (යකීයා පුවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ) (D4)
ශ්‍රී.ල.ම.සේ I ශ්‍රේණිය
අධ්‍යක්ෂ (මහජන යකීයා සේවය හා යකීයා නිවාරණ) (D5)
ශ්‍රී.ල.ම.සේ I ශ්‍රේණිය
ප්‍රධාන ගණකාධිකාරී (AC 01)
ශ්‍රී.ල.ම.සේ I ශ්‍රේණිය
අභ්‍යන්තර විගණක (AC 02)
ශ්‍රී.ල.ම.සේ II/III ශ්‍රේණිය
නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (පාලන) (DD/AD 1)
ශ්‍රී.ල.ම.සේ II / III ශ්‍රේණිය
නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (පාලන) (DD/AD 2)
ශ්‍රී.ල.ම.සේ II / III ශ්‍රේණිය
නීති නිලධාරී (Legal 01)
(දොරටුමන මෙන්කුහක)
නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (සැලසුම් හා ප්‍රගති මෙහෙයුම්) (DD/AD 3)
ශ්‍රී.ල.ම.සේ II/III ශ්‍රේණිය
නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (ශ්‍රම මෙහෙයුම්පොළ තොරතුරු හා ප්‍රවේශණ) (DD/AD 4)
ශ්‍රී.ල.ම.සේ II/III ශ්‍රේණිය
නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (ප්‍රාග්ධන මානව සම්පත් හා යකීයන්හා ප්‍රතිපාදකයි) (DD/AD 5)
ශ්‍රී.ල.ම.සේ II/III ශ්‍රේණිය
නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (රාජකාරිගත සබඳතා) (DD/AD 6)
ශ්‍රී.ල.ම.සේ II/III ශ්‍රේණිය
නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (යකීයා නිවාරණ හා පුවර්ධන) (DD/AD 7)
ශ්‍රී.ල.ම.සේ II/III ශ්‍රේණිය
නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (ආණ්ඩුව මාර්ගෝපදේශ) (DD/AD 8)
ශ්‍රී.ල.ම.සේ II/III ශ්‍රේණිය
නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (මහජන යකීයා සේවය) (DD/AD 9)
ශ්‍රී.ල.ම.සේ II/III ශ්‍රේණිය
ගණකාධිකාරී (AC 01)
ශ්‍රී.ල.ම.සේ II/III ශ්‍රේණිය
අභ්‍යන්තර විගණක (AC 02)
ශ්‍රී.ල.ම.සේ II/III ශ්‍රේණිය
පරිපාලන නිලධාරී
භාෂා පරිවර්තක I / II ශ්‍රේණිය (සිංහල - දෙමළ)
නොතතුරු තාක්ෂණ නිලධාරී I/II/III ශ්‍රේණිය
සංඛ්‍යා ලේඛන නිලධාරී I/II/III ශ්‍රේණිය
වෘත්තීය නිලධාරී සංවර්ධන නිලධාරී I/II/III ශ්‍රේණිය
සංවර්ධන නිලධාරී I/II/III ශ්‍රේණිය
සංවර්ධන නිලධාරී I/II/III ශ්‍රේණිය
සංවර්ධන නිලධාරී I/II/III ශ්‍රේණිය
වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී (02) සංවර්ධන නිලධාරී I/II/III ශ්‍රේණිය
සංවර්ධන නිලධාරී I/II/III ශ්‍රේණිය
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී I ශ්‍රේණිය
කළමනාකරණ සේවා නිලධාරී (I/II/III ශ්‍රේණිය)
පියෙරු, කාර්යාල කාර්ය සහායක
කළමනාකරණ සේවා නිලධාරී (I/II/III ශ්‍රේණිය)
කළමනාකරණ සේවා නිලධාරී (I/II/III ශ්‍රේණිය)
කළමනාකරණ සේවා නිලධාරී (I/II/III ශ්‍රේණිය)
කළමනාකරණ සේවා නිලධාරී (I/II/III ශ්‍රේණිය)
කළමනාකරණ සේවා නිලධාරී (I/II/III ශ්‍රේණිය)
කළමනාකරණ සේවා නිලධාරී (I/II/III ශ්‍රේණිය)
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
වියයේ නිලධාරීන්
1. සාමාන්‍ය පරිපාලනය
2. කාර්ය මණ්ඩල ප්‍රවේශපාලු සම්පූර්ණ කිරීම හා ආරක්ෂණ කටයුතු
3. දොරටුමෙන්තුවේ පුධානත්ව කටයුතු
4. සුභසාධන කටයුතු
5. කාර්ය මණ්ඩල සංවර්ධනය
6. අනෙකුත් අංශ අතර සම්බන්ධීකරණය
වියයේ නිලධාරීන්
1. වාර්ෂික ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම
2. මාසික, කාර්තුමය , වාර්ෂික ප්‍රගතිය සකස් කිරීම
3. ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයිය නිලධාරීන්ගේ ප්‍රගතිය ඇගයීම
4. පාර්ලිමේන්තුවේ අයවැය සඳහා ඉදිරිපත් කරන වාර්ෂිකවට අදාළ කෘත්‍ය දොරටුමෙන්තුවේ අංශ සම්බන්ධීකරණයෙන් ඉදිරිපත් කිරීම.
5. සම්මේලන , සම්මන්තුණ , වැඩමුළු , සංවිධාන කර පැවැත්වීම.
6. ආංශික ශ්‍රම මෙලදෙවොලු නාමියන්ගේ පුගෝකථනය හා ශ්‍රම මෙලදෙවොලු සැලසුම් කිරීම.
වියයේ නිලධාරීන්
1 පරිශ්‍රණයේ හා සම්පත්මණ හා බිඳී අධ්‍යයනය කාර්ය බිඳ අධ්‍යයනය සඳහා සියළුම අංශ සම්බන්ධීකරණය
2. පරිශ්‍රණයේ හා සම්පත්මණ හා බිඳී අධ්‍යයනය කාර්ය බිඳ අධ්‍යයනය සඳහා සියළුම අංශ සම්බන්ධීකරණය
3. පුකිපත්ති විශ්ලේෂණය හා වාර්තා සකස් කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම.
4. ශ්‍රම මෙලදෙවොලු කොතුරු, වාර්තා හා කොතුරු පුකාශන අධ්‍යයනයන්ට අදාළව ඉදිරිපත් කිරීම
5. සම්මේලන , සම්මන්තුණ , වැඩමුළු , සංවිධාන කර පැවැත්වීම.
6. ආංශික ශ්‍රම මෙලදෙවොලු නාමියන්ගේ පුගෝකථනය හා ශ්‍රම මෙලදෙවොලු සැලසුම් කිරීම.
වියයේ නිලධාරීන්
1. මිනිස්බල සංවර්ධනය සඳහා අදාළ පුතිපත්ති සම්පාදනය හා කියාත්මක කිරීම සම්බන්ධයෙන් සියලම පාර්ශවකරුවන් සම්බන්ධීකරණය කිරීම.
2. පුගති සමාලෝචනය හා වාර්තා කිරීම
වියයේ නිලධාරීන්
1. දොරටුමෙන්තුව සහ විදේශ රාජ්‍ය අතර දෙප-ත්තකමේන්තුවේ කටයුතු සම්බන්ධයෙන් වෙත්තා ගන්නා සෙල්ලා සම්බන්ධීකරණය කිරීම කටයුතු
2. කොරියානු, ILO , WAPES , YOU LEAD වාහාති
3. අනෙත් ආයතන සම්බන්ධය විදේශ වාහාති.
වියයේ නිලධාරීන්
යකීයා සමාජ වැඩසටහන හා නීතියේ යකීයා සඳහා මෙළඹවීමේ වැඩසටහන
2. වෘත්තියාත්මක සංවර්ධන පුහුණු වැඩසටහන
3. අභ්‍යන්තර ඔක පුහුණු හා පුාදේශීය යකීයා පොළු වැඩසටහන
4. රාජ්‍ය සේවය , පෞද්ගලික අංශය හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර්
5. විදේශ යකියා පුවර්ධනය
වියයේ නිලධාරීන්
1. වෘත්තීය මාර්ගෝප-දේශනය ලබා දීම
2. හෙල්ප් B සහෝදර සකස් කිරීම.
3. වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය.
4. වෘත්තීය මාර්ගෝප-දේශන අත්පොත් හා මෙනෝමිතික පත්තිකණ යාවත්කාලීනව පවත්වා ගැනීම.
වියයේ නිලධාරීන්
1. අමාත්‍යංශ වැඩසටහන් හා දිස්ත්‍රික් සඳහා වැඩසටහන් වලට අදාළව පුසිධාපන යොමු කිරීම.
2. යකියා සේවා සපයන ආයතන, යකියා අපේක්ෂිතයින්, අධ්‍යාපනයට ලක්වූ / අනාධිත යකියාගත කිරීම, මෙහෙන් ආයතන වලින් යකියාගත කිරීම සිදුවූ යොමු කරන ලිපි සම්බන්ධීක-රණය
3. යකියා පොළු වැඩසටහන
වියයේ නිලධාරීන්
1. දොරටුමෙන්තුවේ මූලය කළමනාකරණ කටයුතු
2. ගණකා සේවය
3. භාණ්ඩ හා සේවා සැපයුම්
වියයේ නිලධාරීන්
1. දොරටුමෙන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු

1.4 කාර්ය මණ්ඩල තොරතුරු

2023 වර්ෂය තුළ ස්ථාන මාරු ලැබ දෙපාර්තමේන්තුව වෙත අන්තර්ග්‍රහණය වූ මාණ්ඩලික නිලධාරීන්

අනු අංකය	නම	තනතුර	සේවයට පැමිණි දිනය
01	කේ.ජී.එච්.එච්.ආර්. කිරිඇල්ල මහතා	අධ්‍යක්ෂ ජනරාල්	2023.05.18
02	සී.කේ. විජේමාන්න මිය	අති. අධ්‍යක්ෂ ජනරාල්	2023.06.08
03	එම්. යූ. අයි. පෙරේරා මිය	පරිපාලන නිලධාරී	2023.05.29

2023 වර්ෂය තුළ ස්ථාන මාරු ලැබ දෙපාර්තමේන්තුවෙන් බැහැර වූ මාණ්ඩලික නිලධාරීන්

අනු අංකය	නම	තනතුර	ස්ථාන මාරු ලැබූ දිනය
01	අනූෂා ගෝකුල ප්‍රනාන්දු මිය	අධ්‍යක්ෂ ජනරාල්	2023.05.17
02	එස්.කේ.ඩබ්.සිසිර කුමාර මයා	අධ්‍යක්ෂ (මහජන රැකියා සේවය)	2023.10.31
03	අරුණ එස්. ආර්. බණ්ඩාර මයා	ස.අධ්‍යක්ෂ (පාලන)	2023.01.20
04	ඩී.එල්.කේ. ප්‍රියවංශ මයා	ස.අධ්‍යක්ෂ(වෘ.මා)	2023.04.03

අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල තොරතුරු 2023.12.31

අනු අංකය	තනතුර	අදාළ වන සේවය	අනුමත	තත්‍ය	පුරප්පාඩු
1	අධ්‍යක්ෂ ජනරාල්	ශ්‍රී.ල.ප.සේ (විශේෂ)	1	1	0
2	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	ශ්‍රී.ල.ප.සේ (විශේෂ)	1	1	0
3	අධ්‍යක්ෂ (පාලන)	ශ්‍රී.ලං.ප.සේ I	1	1	0
4	අධ්‍යක්ෂ (රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ)	ශ්‍රී.ලං.ප.සේ I	1	0	1
5	අධ්‍යක්ෂ (සැලසුම් හා පර්යේෂණ)	ශ්‍රී.ලං.ක්‍ර.සේ I	1	1	0
6	අධ්‍යක්ෂ(මානව සම්පත් කළමනාකරණ)	ශ්‍රී.ලං.ප.සේ I	1	1	0
7	අධ්‍යක්ෂ(මහජන රැකියා සේවය)	ශ්‍රී.ලං.ප.සේ I	1	0	1
8	ප්‍රධාන ගණකාධිකාරී	ශ්‍රී.ලං.ග.සේ I	1	1	0
9	ගණකාධිකාරී	ශ්‍රී.ලං.ග.සේ II/III	1	1	0
10	අභ්‍යන්තර විගණක	ශ්‍රී.ලං.ග.සේ II/III	1	0	1
11	ස.අධ්‍යක්ෂ (පාලන)	ශ්‍රී.ලං.ප.සේ II/III	2	0	2
12	නි. අධ්‍යක්ෂ (සැලසුම් හා ප්‍රගති මෙහෙයුම්)	ශ්‍රී.ලං.ක්‍ර.සේ II/III	1	1	0
13	නි.අධ්‍යක්ෂ (ශ්‍රම වෙළඳපොළ තොරතුරු හා පර්යේෂණ)	ශ්‍රී.ලං.ක්‍ර.සේ II/III	1	1	0

14	ස.අධ්‍යක්ෂ (රැකියා නිර්මාණ, ප්‍රවර්ධන) සහකාර අධ්‍යක්ෂ (වෘත්තීය මාර්ගෝපදේශ)	ශ්‍රී.ලං.ප.සේ II/III	2	0	2
15	නි.අධ්‍යක්ෂ(ජාතික මානව සම්පත් හා රැකිරක්ෂා ප්‍රතිපත්ති)	ශ්‍රී.ලං.ප.සේ II/III	2	1	1
16	ස.අධ්‍යක්ෂ(මහජන රැකියා සේවය)	ශ්‍රී.ලං.ප.සේ II/III	1	1	0
17	නීති නිලධාරී	දෙපාර්තමේන්තු ගත	1	0	1
18	පරිපාලන නිලධාරී	රා.කළ.සේ.අධි	1	1	0
19	භාෂා පරිවර්තක (සිංහල-දෙමළ)	භාෂා පරිවර්තක සේවය II/I	1	0	1
20	භාෂා පරිවර්තක (සිංහල-දෙමළ)	භාෂා පරිවර්තක සේවය I	1	0	1
21	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී	ශ්‍රී ලං.තො.ස.තා.සේ I	1	0	1
22	සංඛ්‍යා ලේඛන නිලධාරී	ක්ෂේත්‍ර ගත/කාර්යාල ගත II/I	1	0	1
23	වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන් *	දෙපාර්තමේන්තු ගත III/ II/I	26	26	0
24	ව්‍යාපෘති නිලධාරීන්	ආශ්‍රිත සේවය III/II/I	3	3	0
25	මානව සම්පත් සංවර්ධන සහකාර නිලධාරීන්	ආශ්‍රිත සේවය III/II/I	6	6	0
26	සංවර්ධන නිලධාරීන්	සංවර්ධන නිලධාරී සේවය III/II/I	554	552	2
27	රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන්	රා.කළ.සේ III/II/I	35	18	17
28	රියදුරු	රියදුරු සේවය III/II/I	8	8	0
29	කාර්යාල කාර්ය සහායක	කාර්යාල සේවක සේවය III/II/I	7	7	0
	එකතුව		664	632	32

1.5 දෙපාර්තමේන්තුවේ අංශ

අනු අංකය	අංශය	හැඳින්වීම
01	පාලන අංශය	දෙපාර්තමේන්තුවේ මෙහෙවර ඉටුකිරීම උදෙසා අභ්‍යන්තර පාලන ක්‍රියාවලියට දායකවීම තුලින් විශිෂ්ඨ කාර්යසාධනයක් ළඟා කරගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ ඉහළ කළමනාකාරිත්වයට සහාය වීම පිණිස ආයතන කටයුතු හා සාමාන්‍ය පරිපාලන කටයුතු මෙහෙයවීම සිදු කරයි.
02	ගිණුම් අංශය	දෙපාර්තමේන්තුවේ මුල්‍ය පරිපාලනමය කටයුතු මෙම අංශය මගින් සිදු කරයි. එමෙන්ම වැටුප් හා වේතන ගෙවීම, සමස්ත මූල්‍ය ප්‍රවාහය කළමනාකරණය, ගබඩා කළමනාකරණය හා විගණන නිලධාරීන් වෙත තොරතුරු සැපයීම සිදු කරයි.
03	අභ්‍යන්තර විගණන අංශය	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38(1)ඊ වගන්ති ප්‍රකාරව ගණන්දීමේ නිලධාරීගේ වගකීම යටතේ අභ්‍යන්තර විගණන අංශය ක්‍රියාත්මක වේ. ඇත. එසේම දෙපාර්තමේන්තුවේ සෑම අංශයකම රාජකාරී කටයුතු ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ චක්‍රලේඛයන්ට අනුව සිදුවනවාද යන්න සොයාබැලීම තුළින් අතපසු වීම්, වැරදි සහ අඩුපාඩු හඳුනාගැනීම මඟින් දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු සඳහා සහාය වීම සිදු කරයි.
04	සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් ඒකකය	දෙපාර්තමේන්තුවේ විවිධ සැළසුම් සකස් කිරීම, දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය මට්ටමේ සේවයේ යෙදෙන මානව සම්පත් සංවර්ධන නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් හා ප්‍රධාන කාර්යාලය අතර සබඳතාවය පවත්වා ගැනීම, එම නිලධාරීන්ගේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය ලබා ගැනීම, විශ්ලේෂණය, ප්‍රගති වාර්තා සකස් කිරීම හා අවශ්‍ය පාර්ශවයන් වෙත ඉදිරිපත් කිරීම මඟින් දෙපාර්තමේන්තුවේ කළමනාකරණයට සහය වීම සිදු කරයි.
05	ශ්‍රම වෙළඳපොළ තොරතුරු හා පර්යේෂණ ඒකකය	ජාතික ශ්‍රම වෙළඳපොල පිළිබඳ කාර්යක්ෂම හා ඵලදායී තීරණ ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදන කාර්යය සඳහාත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අධ්‍යාපන වැඩසටහන්, ප්‍රහුණු හා කුසලතා සංවර්ධන වැඩසටහන් සම්පාදකයින් සඳහාත් අවශ්‍ය ශ්‍රම වෙළඳපොළ තොරතුරු භාවිතයට පහසු වන ආකාරයෙන් සියළු පාර්ශවකරුවන් වෙත තොරතුරු සම්පාදනය සිදුකරනු ලැබේ
06	රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය	සේවාලාභීන්ගේ වෘත්තීය වරණය හා වෘත්තීය සංවර්ධනය සඳහා නිවැරදි වෘත්තීය මාර්ගෝපදේශ සේවාවන් ලබා දෙමින් ශ්‍රම බලකාය නිපුණ හා ගෝලීය ශ්‍රම වෙළඳපොලට ගැලපෙන ආකාරයෙන් ගොඩනැගීමට දායකත්වය ලබා දීම සිදු කරයි.
07	මානව සම්පත් කළමනාකරණ අංශය	අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති ශ්‍රී ලංකා ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය මෙරට තුළ ක්‍රියාත්මක කරවීමට හා අවශ්‍ය සංශෝධනයන් සිදු කිරීමට අවශ්‍ය මැදිහත්වීම හා අදාල ආයතන වෙත සහාය ලබාදීම. දෙපාර්තමේන්තුවේ විෂය පථයට අදාළව ජාත්‍යන්තර ආයතන විසින් මෙරට ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සම්බන්ධීකරණ කිරීම සිදු කිරීම. දෙපාර්තමේන්තු නිලධාරීන් වෙත අවශ්‍ය තොරතුරු තාක්ෂණ පහසුකම්, දැනුම ලබාදීම හා දෙපාර්තමේන්තුවේ වැඩසටහන් ප්‍රචාරණ කටයුතු මෙහෙයවීම සිදු කරයි.
08	මහජන රැකියා සේවා අංශය	ශ්‍රී ලාංකික ශ්‍රම බලකාය සඳහා පුද්ගලික අංශයේ ඵලදායී රැකියා අවස්ථාවන් කාර්යක්ෂම ලෙස ලබාදීම අරමුණු කරගෙන දිස්ත්‍රික්ක 25 හිම මහජන රැකියා සේවා මධ්‍යස්ථාන ස්ථාපිත කර කළමනාකරණය සිදු කරයි.

දිස්ත්‍රික් මහජන රැකියා සේවා මධ්‍යස්ථාන ක්‍රියාත්මක වන ස්ථාන හා සම්බන්ධීකරණ නිලධාරීන්

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ජනක බණ්ඩාර මයා 011- 2369258	
	ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සෙනරත් ගමගේ මයා 033 - 2248990
කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය දීප්ති කුමාරි මිය 034 - 2236162	
	මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ශෂික අබේසිංහ මයා 081- 2068229
මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ශිරන්ති වත්තේගෙදර මිය 066 - 2222824	
	නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඩබ්. සිරිසේන මයා 052 - 2224186
ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ජී.එස්. ගුණවර්ධන මයා 091 - 2233906	
	මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ජී. ප්‍රේමසිරි මයා 041 2231319
කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ටී. කමලදාසන් මයා 021 - 2283739	
	මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වී. තිරුඅානන්දරාසා මයා 065 - 2227193
අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පී. පුවිතා මිය 063- 2224499	
	ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ජෙසීනා ෆස්මි මිය 026 - 2242393
කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ජී.ඒ. කුමාරි මිය 037 - 2221402	
	පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය එන්.පී. හේරත් මයා 032 - 2266253
බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය එස්.ඒ. බණ්ඩාර මයා 055 - 2228030	

	අනුරාධපුරය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කේ. විජේසිංහ මයා 025 - 2234988
පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ජේ.ජී. විජේසිංහ මයා 027 - 2056715	
	හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කේ. විමලරත්න මයා 047 - 2256401
මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය එන්.කේ. හේරත් මයා 055 - 2277248	
	රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අසංක තිලකරත්න මයා 045 - 2232996
කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය එස්. ජයවීර මයා 035 - 2221733	
	යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ලිස්ටන් රජිනිකාන්ත් මයා 021 - 2219359
මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ඒ.පී. ප්‍රනාන්දු මිය 023 - 3120624	
	මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ජේ. තුසිරාජ් මයා 021- 2290037
වව්නියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සී. රාජේෂ්වරී මිය 024 - 2228025	

1.6 දෙපාර්තමේන්තුවේ අංශයන්හි කාර්යභාරය

අනු අංකය	අංශය	කාර්යභාරය
01	පාලන අංශය	1. නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම 2. පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම හා පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම 3. ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම 4. දෛනික තැපෑල 5. බඳවා ගැනීම්, විනය පාලනය, දෙපාර්තමේන්තු මෙහෙයුම් පරිපාලන කටයුතු 6. ප්‍රවාහන කටයුතු
02	ගිණුම් අංශය	1. වැටුප් හා වේතන ගෙවීම 2. සමස්ත මූල්‍ය ප්‍රවාහය කළමනාකරණය 3. ගබඩාකරණය 4. විගණන නිලධාරීන් වෙත තොරතුරු සැපයීම
03	අභ්‍යන්තර විගණන අංශය	1. විශේෂ විමර්ශණ කටයුතු 2. දෙපාර්තමේන්තුවේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම හා පූර්ව හා පසු කටයුතු 3. අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම හා පූර්ව හා පසු කටයුතු 4. අවදානම් ලේඛනය හා අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම 5. අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව කටයුතු කිරීම 6. පසු විපරම් වාර්තා සකස් කිරීම
04	ශ්‍රම වෙළඳපොළ තොරතුරු හා පර්යේෂණ ඒකකය	1. අධ්‍යයන වාර්තා සකස් කිරීම 2. පාර්ශවකාර ආයතන සමඟ විවිධ සංවාදශීලී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 3. ශ්‍රම වෙළඳපොළ අධ්‍යයන වාර්තා සකස් කිරීම 4. මාසික ප්‍රවත්පත් සඟරා සකස් කිරීම 5. ශ්‍රම වෙළඳපොළ තොරතුරු සමාජගත කිරීම 6. සමාජ ආර්ථික දත්ත අත්පොත සකස් කිරීම
05	රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය	1. වෘත්තීය මාර්ගෝපදේශ සේවා ලබාදීම (රැකියා අපේක්ෂිතයින්, දෙමාපියන්, ගුරුවරුන් සඳහා) 2. ස්වයං රැකියා සඳහා පෙළඹවීමේ වැඩසටහන් පැවැත්වීම 3. පාසල් සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ සේවා සැපයීම 4. වෘත්තීය මාර්ගෝපදේශ අත්පොත් යාවත්කාලීන කිරීම 5. හසර සඟරාව සකස් කිරීම

06	සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් ඒකකය	1. දෙපාර්තමේන්තුවේ සියළුම අංශ සහභාගි කර ගනිමින් උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම. 2. දෙපාර්තමේන්තුවේ උපාය මාර්ගික සැලැස්මට අනුකූලව සියළුම අංශ සහභාගී කරගනිමින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ඊට අනුකූලව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අනුයුක්ත කර සිටින නිලධාරීන් සඳහා වාර්ෂික ඉලක්ක ලබා දීම. 3. ව්‍යාපෘති යෝජනා සකස් කිරීම හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කර අනුමැතිය ලබා ගැනීම 4. දෙපාර්තමේන්තුවේ මාසික ප්‍රගති වාර්තා සකස් කිරීම 5. වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීම හා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා යොමු කිරීම 6. වාර්ෂිකව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමට අනුයුක්ත කර සිටින දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇගයීම 7. පහත සඳහන් රැස්වීම් පැවැත්වීම හා එම රැස්වීම් සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම ■ දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන්ගේ රැස්වීම් ■ අර්ධ වාර්ෂික හා වාර්ෂික ප්‍රගති සමාලෝචන රැස්වීම් ■ දිස්ත්‍රික් මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම ■ අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම ■ අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ප්‍රගති සමාලෝචන රැස්වීම ■ විගණන හා කළමනාකරණ කමිටුව - දෙපාර්තමේන්තුව ■ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම - අමාත්‍යාංශය 8. දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අනුයුක්ත කර සිටින දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්ගේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ දත්ත පද්ධතිය පවත්වාගෙන යාම.

07	මානව සම්පත් කළමනාකරණ අංශය	1. ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය යටතේ එක් එක් ක්ෂේත්‍රයන්හි ප්‍රවර්ධනයට සම්බන්ධ අදාළ ආයතන වෙත නිර්දේශ හා යෝජනා ඉදිරිපත් කිරීම 2. ශ්‍රී ලංකාවේ මානව සම්පත් කළමනාකරණය හා ඵලදායී භාවිතය පිළිබඳ නිර්දේශ හා යෝජනා ඉදිරිපත් කිරීම 3. මාර්ගගත රැස්වීම් සඳහා පහසුකම් සැලසීම 4. දෙපාර්තමේන්තු අභ්‍යන්තර කළමනාකරණ තොරතුරු පද්ධති සකස් කිරීම අධීක්ෂණය 5. දෙපාර්තමේන්තු කටයුතු ඩිජිටල්කරණය කිරීමට අදාල නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම 6. දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය හා ඊට අනුබද්ධ රැකියා අපේක්ෂිතයන් හා රැකියා සපයන ආයතන ලියාපදිංචි වන web Portal කළමනාකරණය කිරීම 7. දෙපාර්තමේන්තුව සතුව පවතින සමාජ මාධ්‍ය ජාලා හා (FB, YouTube, Twitter, linkedin, TikTok) පවත්වාගෙන යාම 8. මාර්ගගතව දෙපාර්තමේන්තුවට යොමුවන ගැටළු සඳහා පිළිතුරු සැපයීම. 9. ගෝලීය වශයෙන් පවතින රැකියා වෙළඳපොළ හා අනාගත රැකියා අවස්ථා පිළිබඳව දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීම 10. දෙපාර්තමේන්තු විෂය පථයට අදාළව ජාත්‍යන්තර සංවිධාන විසින් මෙහෙයවන වැඩසටහන්/ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය
08	මහජන රැකියා සේවා අංශය	1. රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කිරීම 2. රැකියා අපේක්ෂිත තොරතුරු ඇතුළත් Live Dashboard කළමනාකරණය කිරීම. 3. දිස්ත්‍රික් වෘත්තීය පොළ පැවැත්වීම 4. පුද්ගලික අංශයේ ආයතන ලියාපදිංචි කරගැනීම 5. රැකියා අපේක්ෂිතයින්ගේ සුදුසුකම් අනුව රැකියා ගැළපීම් සිදුකිරීම හා සම්මුඛ පරීක්ෂණ සඳහා යොමුකිරීම 6. රැකියාගත කිරීම හා පසුවිපරම් කිරීම 7. රැකියා පුරප්පාඩු පිළිබඳ රැකියා අපේක්ෂිතයින් දැනුවත් කිරීම 8. වෘත්තීය පුහුණුව සඳහා ප්‍රවේශ පහසුකම් සැපයීම 9. රැකියා තත්ත්වයන් පිළිබඳ සංඛ්‍යා ලේඛන රැස්කිරීම හා ප්‍රකාශයට පත් කිරීම 10. විදේශීය රැකියා අවස්ථා සඳහා මඟපෙන්වීම 11. දිස්ත්‍රික් රැකියාපොළ වැඩසටහන සංවිධානය කර පැවැත්වීම

02

පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2023 වර්ෂය තුළ මූල්‍ය ප්‍රතිපාදන නොමැතිව සිදු කරන ලද වැඩසටහන් සඳහා ගණනය කළ මූල්‍යමය වටිනාකම් පැවරීම

අනු අංකය	වැඩසටහන	මූල්‍ය ප්‍රතිපාදන යටතේ වැඩසටහන සිදුකලේ නම් එක් ප්‍රතිලාභියෙකු සඳහා වියදම (A)	ප්‍රතිලාභීන් සංඛ්‍යාව (B)	ගණනය කළ මූල්‍යමය අගය (A)* (B)
01	දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන	200.00	20,161	4,032,200.00
02	ස්වයං රැකියා පෙළඹවීම වැඩසටහන	200.00	10,435	2,087,000.00
03	අවශ්‍යතා මත පුහුණු වැඩසටහන්	200.00	6,273	1,254,600.00
04	ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන	200.00	1,191	238,200.00
05	රැකියා අපේක්ෂිතයින් දැනුවත් කිරීම	200.00	22,814	4,562,800.00
06	ව්‍යවසායකත්ව සංවර්ධන එක්දින වැඩසටහන	200.00	3,033	606,600.00
07	වෘත්තීය මාර්ගෝපදේශ සේවා සැපයීම	200.00	30,840	6,168,000.00
මුළු එකතුව			**105,065**	**21,013,000.00**

2.1 ආංශික ප්‍රගතිය

2.1.1. අභ්‍යන්තර විගණන අංශය - අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව කටයුතු කිරීම 2023

අනු අංකය	විමසුම් ගොනු අංකය	විගණන විමසුම	අදාළ අංශය	විමසුම භාරදුන් දිනය	පිළිතුරු ලද දිනය
01	DME/09/02/03/01	පුද්ගලික ලිපිගොනු නඩත්තු පරීක්ෂාව	පාලන අංශය	2023.01.25	2023.02.13
02	DME/09/01/01/01	සේවක පුහුණු	පාලන අංශය	2023.02.01	2023.02.21
03	DME/09/02/03/01	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්ගේ නිවාඩු	පාලන අංශය	2023.03.01	2023.03.14
04	DME/09/01/01/01	මුදල් පොත, වැය ලෙජර් අනිකුත් පොත්පත් නඩත්තුව හා CIGAS වැඩසටහන	ගිණුම් අංශය	2023.04.20	2023.05.11
05	DME/09/02/03/01	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සේවක තුලනය	පාලන අංශය	2023.05.11	2023.06.14

06	DME/09/01/01/01	ආපදා ණය	පාලන අංශය	2023.06.06	2023.07.06
07	DME/09/02/03/01	ප්‍රසම්පාදන කටයුතු කළමනාරණය කිරීම	ගිණුම් අංශය	2023.06.15	2023.09.06
08	DME/09/01/01/01	ගෙවීම් වුවචර් කළමනාකරණය 2023	ගිණුම් අංශය	2023.07.29	2023.09.06
09	DME/09/02/03/01	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ වැටුප් ගෙවීම	ගිණුම් අංශය	2023.09.01	2023.09.07
10	DME/09/01/01/01	පොදු තැන්පතු ගිණුම	ගිණුම් අංශය	2023.09.11	202309.14
11	DME/09/02/03/01	වාහන නඩත්තුව 2022 පෙබරවාරි- 2023 නොවැම්බර්	පාලන අංශය	2023.12.04	2024.01.03
12	DME/09/01/01/01	අත්තිකාරම් ගෙවීම් හා පියවීම	ගිණුම් අංශය	2023.12.06	2024.02.28
13	DME/09/01/01/01	ක්‍රියාකාරී ශ්‍රම වෙළඳපොළක් සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීම(MIS)	මානව සම්පත් කළමනාකරණ අංශය	2023.12.11	2024.01.11
14	DME/09/02/03/01	ස්ථාන මාරු	පාලන අංශය	2024.01.23	2024.01.23

2.1.2. ශ්‍රම වෙළඳපොළ තොරතුරු අංශය - 2023 වර්ෂයේ ප්‍රගතිය

අනු අංකය	වැඩසටහන	ප්‍රගතිය
01	නිල් මානෙල් මල් ආශ්‍රිත නවෝත්පාදන වෙළඳපොළ විභවතාවය	අනුරාධපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් නිෂ්පාදන ගම්මානයක් ආශ්‍රිතව වර්තමාන නිෂ්පාදනය, එහි අගය එකතු කිරීමත් ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමේ හැකියාවත් පිළිබඳව විග්‍රහ කර සාම්ප්‍රදායික ව්‍යවසායක කටයුත්තකින් බැහැරව නව නිෂ්පාදනයක් ලෙස තරුණ ප්‍රජාව වෙත නව ව්‍යවසායකයින් පිලිබඳ තොරතුරු ව්‍යාප්ත කිරීමේ අරමුණින් සිදු කරන ලදී.
02	ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස පොලිතින් හා ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය	ප්ලාස්ටික් හා පොලිතින් අපද්‍රව්‍ය වැඩි ප්‍රමාණයක් සාමාන්‍ය අපද්‍රව්‍ය ලෙස බැහැර කෙරේ. සුළු ප්‍රමාණයක් පමණක් විශේෂිතව එකතුකර ප්‍රතිචක්‍රීයකරණ ක්‍රියාවලියට යොමු කෙරේ. මෙම අධ්‍යයනයේදී මෙම ද්‍රව්‍ය එක්රැස් කිරීමේ වර්තමාන ක්‍රමවේදයන් ද ඒවා සඳහා වැය වන පිරිවැය ද අමු ද්‍රව්‍ය සඳහා ගෙවනු ලබන මිල හා ද්‍රව්‍ය චක්‍රීකරණය කර වෙනත් නිෂ්පාදන සඳහා වන අමු ද්‍රව්‍ය ටොන් එකක් සඳහා වන වියදම හා ක්‍රමවේදයන් ද අධ්‍යයනය කරන ලදී. මෙහිදී එම ද්‍රව්‍ය රැස් කර එකතු කරන මධ්‍යස්ථාන වෙත ලබා දීම, තොග රැස්කිරීම හා ප්‍රතිචක්‍රීකරණය කර නිෂ්පාදන අමු ද්‍රව්‍ය සැකසීම හා අගය එකතු කිරීම ලාභදායී ව්‍යවසායක්

අනු අංකය	වැඩසටහන	ප්‍රගතිය
		ලෙස සිදුකළ හැකි බැවින් ව්‍යාපාරිකව පොලිතින් හා ප්ලාස්ටික් එකතුකිරීම මඟින් රැකියා අවස්ථා ජනිත කිරීම පිළිබඳව මෙම පර්යේෂණය ඉලක්ක විය.
03	අපනයන වෙළඳපොළ සඳහා තල් ආශ්‍රිත නිෂ්පාදන	දිවයිනේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල සාම්ප්‍රදායිකව තල් වගාව ව්‍යාප්තවී ඇත. එම ප්‍රදේශවල විවිධ කර්මාන්තයන් තල්වගාව මත පදනම්ව ක්‍රියාත්මක වේ. නිවෙස් ගත කාන්තාවන් සඳහා තම අතිරික්ත කාලය තුළදී ආදායම් උත්පාදනය කළහැකි නිෂ්පාදනයක් ලෙස විදේශ වෙළඳපොළ ඉලක්ක කොට ඉදිරිපත් කළ හැකි විවිධ නිෂ්පාදන හා ඒවායේ නිෂ්පාදන විභවතාව මෙම අධ්‍යනයේදී ඉලක්ක කර ඇත.
04	අත්යන්ත්‍ර රෙදිපිළි ව්‍යාපාර මුල් කරගනිමින් ප්‍රවර්ධන ආකෘති සකස් කිරීම - 50%	අත්යන්ත්‍ර නිෂ්පාදන සඳහා සැලකිය යුතු වෙළඳපලක් පවතී. මෙහි මූලික අරමුණු පළාත් මට්ටමින් නිෂ්පාදකයින්ව හඳුනා ගැනීම හා ඔවුන් ප්‍රධාන ගැණුම් කරුවන් හා අලෙවි කරුවන් වෙත සම්බන්ධ කිරීමයි. මෙහිදී පොදු නිෂ්පාදන හඳුනා ගැනීම හා ඒවායේ මිල ගණන්, නිෂ්පාදන හඳුනා ගැනීම්, කර්මාන්තය සඳහා ඇති ගැටළු ආදිය පිළිබඳව අවධානය යොමු කරන ලදී. තරුණ නිෂ්පාදකයින් දිරිගැන්වීම මෙහි අරමුණ යි. දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් සම්බන්ධ කරගනිමින් නිෂ්පාදකයින් හා මිලදීගන්නන් අතර සම්බන්ධීකරණය කිරීම මඟින් තව දුරටත් කාර්යබද්ධ පර්යේෂණ ක්‍රියාත්මක කෙරේ.
05	ව්‍යාපාරික සක්‍රීය කාබන් නිෂ්පාදනය	පොල් කටු පාලිත තත්ව සහිත පිළිස්සීම් පිළිබඳ අවධානය යොමු කළ අතර එමඟින් ගුණාත්මකභාවය ඉහළ සක්‍රීය කාබන් (activated carbon) ලබා ගත හැක. මෙම සිද්ධි අධ්‍යයනය සඳහා කුරුණෑගල හා රත්නපුර දිස්ත්‍රික්කයන්හි ස්ථාන කීපයක් මූලිකව විමර්ශනය කළ අතර එම ආයතන වර්ථමාන වෙළඳපොළ ආර්ථික තත්වය හේතුවෙන් නිෂ්පාදන කටයුතු නවතා දමා ඇති බවත් නිරීක්ෂණය විය. එහෙයින් ව්‍යාපාරයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට යෝජිත කාර්යබද්ධ පර්යේෂණය නවතා ලීමට කටයුතු කළ බවත් 2024 වර්ෂයේදී මෙම කර්මාන්තය පිළිබඳ වෙළඳපොළ ගැටළු අධ්‍යනය කිරීමට සැලසුම් කර ඇත
06	පුවක් කොළපත් ආශ්‍රිත නිෂ්පාදන	නිෂ්පාදන ආයතන පිළිබඳ නියැදින් සපයාගත නොහැකි වූ බැවින් අධ්‍යයනය අත්හිටුවන ලදී.
07	බුලත් නිෂ්පාදනය පදනම් කර ගනිමින් ප්‍රවර්ධන ආකෘති සකස් කිරීම	ගම්පහ, කුරුණෑගල, මාතලේ යන දිස්ත්‍රික්ක පදනම් කරගෙන තොරතුරු කැඳවන ලදි. ක්ෂේත්‍ර බුලත් නිෂ්පාදකයින් 74 ක් ද, තොග ගැනුම්කරුවන් 15 දෙනෙකු ද හඳුනාගෙන ඇත. අපනයන විභවය හා බුලත් වර්ග සලකා ඉදිරි යොමු කිරීම් සිදු කිරීමට නියමිතය. දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් සම්බන්ධ කරගනිමින් නිෂ්පාදකයින් හා මිලදීගන්නන් අතර සම්බන්ධීකරණය කිරීම අරඹයා තව දුරටත් කාර්යබද්ධ පර්යේෂණය ක්‍රියාත්මක කෙරේ.

අනු අංකය	වැඩසටහන	ප්‍රගතිය
බුද්ධි කලම්බන - **Brain Storming - 03**		
01	ශ්‍රම වෙළඳ පොළ තොරතුරු පද්ධතියක අවශ්‍යතාවය	සෑම මහජන රැකියා සේවයකම නිසි ක්‍රියාකාරීමය, තීරණ ගැනීමේ පහසුව සඳහා නිවැරදි හා කාලීන හා ප්‍රාදේශීය ලෙස වෙන් කිරීම් සඳහා ශ්‍රම වෙළඳපොළ තොරතුරු අවශ්‍ය වේ. ඒ සඳහා වන පාර්ශවකරුවන් කවුරුන් ද, පාර්ශවකරුවන්ගේ ක්‍රියාකාරීත්වය හා ඔවුන් සැපයිය යුතු දත්ත , තොරතුරු ලබා දීමේ සීමා හා වපසරි හා කුමන ආයතනයක් මෙහි ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානය විය යුතු දැයි සාකච්ඡා විය. මේ සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුවේ, හාම්පුතුන්ගේ සම්මේලනය උපත් මරණ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය නියෝජනය විය.
02	ආර්ථිකව ආයුර්වේද ඖෂධ නිෂ්පාදන මගින් රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන හැකියාව	ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ප්‍රධාන වෛද්‍ය ක්‍රම දෙක අතරින් ආයුර්වේද ක්ෂේත්‍රය ශාක මුල ඖෂධ මත රදා පවතී. එසේම ශ්‍රී ලංකාවේ සැලකිය යුතු පිරිසක් තවමත් එම ප්‍රතිකාර පද්ධතිය යොදා ගනී. මේ හේතුවෙන් සැලකිය යුතු විනිමය ප්‍රමාණයක් ඖෂධ ආනයනය සඳහා විදේශ වෙත ඇදී යයි. දේශීයව වගා කළ හැකි ඖෂධීය ශාක ක්‍රමවත්ව හා සැලසුම් සහගතව වගා කිරීම හා අස්වනු සැකසීම මගින් දේශීය රැකියා නිර්මාණය හා ආදායම් උත්පාදනය සිදු කළ හැකිවේ. තවදුරටත් අගය එකතු කිරීම මගින් විදේශී විනිමය ගලායාම පාලනය කළ හැක. ඉහත කරුණු අළලා වාර්තාව සකස්කර ඇත.
03	ශ්‍රී ලාංකික ජනගහනය වයස් ගත වීම	ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් වෛද්‍ය හා ආහාර පහසුකම් වර්ධනය වීම සමග උපතේ දී ආයු අපේක්ෂාව ඉහල ගොස් ඇත.එසේම උපත් අනුපාතය ද පහළ යාම මගින් අඩු වයස් යැපෙන්නන් සංඛ්‍යාව අඩු වී වැඩිහිටි යැපෙන්නන් ඉහළ ගොස් ඇත. මේ මගින් ඔවුනට සේවය සැපයීම, රැක බලා ගැනීම, සමාජීය කටයුතු සඳහා යොදා ගැනීම , වෛද්‍ය පහසුකම් සැපයීම සඳහා දේශීය ආර්ථිකයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් වෙන් කළ යුතු වේ. සංවර්ධනය වෙමින් පවතින රටකට එම පිරිවැය දැරීමේ ක්‍රමවේද හා වැඩිහිටි සුභ සාධන සඳහා ඇති වෛකල්පිත ක්‍රමවේද අධ්‍යයනය කරන ලදී.

ඒක පුද්ගල පර්යේෂණ - (Individual Research) – 07

අනු අංකය	පරීක්ෂණය/අධ්‍යයනය	ප්‍රගතිය හා වර්තමාන තත්වය
1.	ඇඟළුම් ක්ෂේත්‍රයේ රැකියා බිඳවැටීම පිළිබඳ සමීක්ෂණය	මෙම අධ්‍යයනය සඳහා අපනයන සංවර්ධන මණ්ඩලයෙන් ලබාගත් ඇඟළුම් ආයතන 365 කින් තෝරා ගත් නියැදියකට අනුව කොළඹ, කළුතර, ගම්පහ, රත්නපුර, මහනුවර, නුවරඑළිය, අනුරාධපුරය සහ කුරුණෑගල යන දිස්ත්‍රික්ක තෝරා ගෙන ඇත. ඒ අනුව දිස්ත්‍රික්ක 08 හි ඇඟළුම් ආයතන නියැදියක් භාවිතා කර ඇඟළුම් ක්ෂේත්‍රයේ ආයතන මුහුණදෙන සේවක ගැටළු අධ්‍යයනය කරන ලදී. එමගින් ශ්‍රම වෙළඳපොළ වැදගත් සේවා නියුක්ති අවස්ථාවක් වන ඇඟළුම් ක්ෂේත්‍රය අධ්‍යයනයට ලක් කර ඇත.
2.	**ඉදිකිරීම් ක්ෂේත්‍රයේ රැකියා බිඳවැටීම පිළිබඳ සමීක්ෂණය.**	ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ රැකියා බිඳවැටීම පිළිබඳ අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු වන්නේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පවතින රැකියා හඳුනා ගැනීම , අහිමි වී ඇති රැකියා හඳුනා ගැනීම හා ඉදිකිරීම් කර්මාන්තකරුවන් අනුගමනය කරන විකල්ප ආදායම් උපායමාර්ග හඳුනා ගැනීමයි . සියළුම දිස්ත්‍රික්ක නියෝජනය වන පරිදි තෝරා ගත් නියැදියක් ඇසුරින් පර්යේෂණය සිදුකර ඇත.
3.	**ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම දායකත්වය සහ කාන්තාවන්ට රැකියා සඳහා යොමු වීමේදී පවතින ගැටලු**	ඉහත අධ්‍යයනය සඳහා මුලතිව් දිස්ත්‍රික්කය හැර සෙසු දිස්ත්‍රික්ක සියල්ල ආවරණය කරමින් සමීක්ෂණය සඳහා සේවා නියුක්ත කාන්තාවන් 2103 ක්ද සේවා වියුක්ත කාන්තාවන් 2026 ක්ද වශයෙන් යොදා ගන්නා ලදී. මෙම පර්යේෂණය මඟින් සේවා නියුක්ත කාන්තාවන් මුහුණදෙන ගැටළු හා කාන්තාවන් සේවා වියුක්ත වීමට බලපාන සාධක පිළිබඳව අධ්‍යයනය කර ඇත.
4.	ආබාධිත ප්‍රජාවගේ රැකියා යෝග්‍යතාවය පිළිබඳ සමීක්ෂණය	ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය වේගවත්ව සිදු වීමට නම් රටේ වැඩ කළ හැකි සියළු ප්‍රජාව ආර්ථික සංවර්ධනයට දායක කර ගැනීම වැදගත් වේ. ආබාධිත ප්‍රජාවද යම් කිසි රැකියාවකට හෝ වෙනත් වෘත්තියකට යොමු කිරීම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට වැදගත් අවශ්‍යතාවයක් ලෙස දැක්විය හැකිය. එසේම එම ප්‍රජාව සඳහා වන සුබ සාධන වියදම්ද අවම කර ඔවුන් සමාජානුයෝජනය කළ හැකිය. ඒ අනුව 15-35 වයස් කාණ්ඩයේ ආබාධිත ප්‍රජාවගේ රැකියා යෝග්‍යතාව අධ්‍යයනය කරන ලදී.
5.	සාමාන්‍ය අධ්‍යාපනය වර්තමාන ප්‍රතිපත්ති, ගැටලු හා විසඳුම්	**සාමාන්‍ය අධ්‍යාපනය (General Education):** සාමාන්‍ය අධ්‍යාපනය මූලික අරමුණු වනුයේ පුද්ගලයෙකුගේ සාර්ථක ජීවිතයකට අවශ්‍ය ජීවිත කුසලතා (Life Skills)අත්පත් කර ගැනීමට සහය වීමයි. මේ සඳහා වූ වර්තමාන ප්‍රතිපත්ති හා සබැඳි ප්‍රස්තුතයන් හා ගැටලු සාකච්ඡා කරන ලදී. මෙය මෙම ක්ෂේත්‍රය පිළිබඳ වූ ප්‍රාථමික හා ද්විතියික තොරතුරු/ දත්ත විශ්ලේෂණය මඟින් සිදු කරන ලදී.

2.1.3 වෘත්තීය මාර්ගෝපදේශ අංශය - 2023 වර්ෂයේ ප්‍රගතිය

අනු අංකය	වැඩසටහන	ප්‍රගතිය
01	"නැණ ජය" වෘත්තිය මාර්ගෝපදේශ වැඩසටහන	ලංකා බැංකුවේ අනුග්‍රහය මත අ.පොෂ උසස් පෙළ සිසු දරුවන් උදෙසා ක්‍රියාත්මක කරන ලද මෙම වැඩසටහන සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් ක්‍රියාත්මක කරන ලදි. වැඩසටහන් 16 ක් තුළින් ප්‍රතිලාභීන් 5000 ක් වෙත සේවය සපයා ඇත.
02	"Skill Scan Clinic "වැඩසටහන	රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ දරුවන් සහ අ.පොෂ උසස් පෙළ සුදුසු කම් නොලද සිසුන් සඳහා අධ්‍යාපනික හා වෘත්තිය තීරණ ගැනීමට සහය වීම සඳහා සෙත්සිරිපාය ප්‍රධාන කර්යාලය සහ පොලොන්නරු දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. ප්‍රතිලාභීන් ගණන 300 කි.
03	වීඩියෝ පට සකස් කිරීම	දිස්ත්‍රික් හා ප්‍රාදේශිය මට්ටමින් පවත්වනු ලබන රැකියාපොල/වෘත්තිය පොල වැඩසටහන් වලදී රැකියා අපේක්ෂිතයන්, පාසල් දරුවන් හා පාසල් හැරගිය පිරිස් දැනුවත් කිරීම සඳහා පහත තේමාවන් ඔස්සේ සිංහල හා දෙමළ මාධ්‍යයෙන් විඩියෝ පට 6 ක් සකස් කිරීමට කටයුතු කිරීම. 1)දේශීය හා විදේශීය රැකියා අවස්ථා සම්බන්ධයෙන් පවත්නා ප්‍රවණතා පිළිබඳව 2)නිපුණතා සංවර්ධනයේ වැදගත්කම හා නව ප්‍රවණතා සම්බන්ධව 3) ව්‍යවසායකත්ව අවස්ථා සහ සාර්ථක අත්දැකීම් සම්බන්ධව
04	උසස් පෙළ සිසුන් හා පාසල් හැර ගිය සිසුන් සඳහා වැඩලෝකයට නිපුණතාවයෙන් යුතුව පිවිසීම පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා දීමේ වැඩසටහන	අ.පොෂ උසස්පෙළ සිසුන්ට ප්‍රායෝගික වැඩ අත්දැකීම් ලබා දීම අරමුණු කර ගනිමින්, වෘත්තිය පුහුණු ආයතන වෙත ක්ෂේත්‍ර නිරීක්ෂණ චාරිකා සංවිධානය කර එම ආයතන කේන්ද්‍ර කරගනිමින් සිංහල සහ දෙමළ මාධ්‍ය වැඩසටහන් 11 ක් ක්‍රියාත්මක කරන ලදි. ප්‍රතිලාභී පාසැල් සිසුන් සංඛ්‍යාව 750 කි.
05	රැකියා අපේක්ෂිතයන් විදේශ රැකියා සඳහා බලගැන්වීම	දැනට අවිධිමත් අංශයේ සේවයේ නිරත ශ්‍රමිකයින් අතරින් අත්දැකීම් සහිත නමුත්, විධිමත් වෘත්තීය පුහුණු සහතික නොමැති පුද්ගලයින් හට පෙර හැදුනුම් ඉගෙනුම් ක්‍රමය (RPL) හරහා NVQ සහතික ලබාගැනීමේ වැදගත්කම පැහැදිලි කිරීමට දිවයිනම ආවරණය වන පරිදි වැඩසටහන් පවත්වන ලදී. RPL ක්‍රමවේදයෙන් NVQ සහතික ලබාගැනීමට කැමැත්ත පලකළ ශ්‍රමිකයින් සංඛ්‍යාව 2416 කි. (වැඩසටහන් 106 ක් පවත්වා ඇත.)
06	උද්‍යාන අලංකරණ වැඩසටහන	උද්‍යාන අලංකරණ ක්ෂේත්‍රයේ නිපුණ වෘත්තියකයන් හා ව්‍යවසායකයන් බිහිකිරීම අරමුණු කරගනිමින් ගම්පහ, කොළඹ,කළුතර දිස්ත්‍රික් ආවරණය වන පරිදි වැඩසටහන් 3ක් ක්‍රියාත්මක කරන ලදි. ප්‍රතිලාභීන් 90

07	ස්වයං රැකියා සඳහා තාක්ෂණික පුහුණුව ලබාදීම	• විසිතුරු මත්ස්‍ය වගාව • සබන් හා සෝදන කුඩු නිෂ්පාදනය • ඉදල් කොහු නිෂ්පාදනය ප්‍රතිලාභීන් සංඛ්‍යාව 100 ක්

2.1.4 මානව සම්පත් කළමානාකරණ අංශය - 2023 වර්ෂයේ ප්‍රගතිය

අනු අංකය	වැඩසටහන	ප්‍රගතිය
08	ගරු සරු වැඩසටහන	කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය ගරු මනුෂ නානායක්කාර මැතිතුමාගේ සංකල්පයක් අනුව ශ්‍රී ලංකාව තුල අවිධිමත් අංශයේ සේවයේ නිරත ශ්‍රමිකයින් උදෙසා සේවා ගරුත්වය හිමිකර දීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. මෙම වැඩසටහන තුළින් අවිධිමත් අංශයේ සේවයේ නිරත ශ්‍රමිකයන්ගේ සමාජ ආරක්ෂණය තහවුරු කෙරෙන අතරම, ඔවුන්ගේ කාර්යයන්හි වැදගත්කම සහ වටිනාකම ප්‍රජාව වෙත අවධාරණය කරනු ඇත. එමෙන්ම, අවිධිමත් අංශයේ ශ්‍රමිකයන්ගේ සේවා ගරුත්වය හඳුනා ගැනීම සහ ප්‍රවර්ධනය කිරීම මඟින් විවිධ අවිධිමත් රැකියාවල නියැලී සිටින ශ්‍රමිකයන් සඳහා වඩාත් හොඳ ආර්ථික යහපැවැත්මක්, සමාජ තත්ත්වයක් හිමිවන පරිදි විධිමත් සේවාවක් ලෙස අදාල රැකියාව/ සේවාව ස්ථාපිත වීමට මඟ පෙන්වීම සිදු කෙරේ. 02. ඒ අනුව, මෙහි සමාරම්භක වැඩසටහන 2023.11.01 වන දින පැවැත්වූ අතර අවිධිමත් අංශයේ පහත ක්ෂේත්‍ර නියෝජනය කරන ශ්‍රමිකයින් සමඟ පළමු අදියර ක්‍රියාත්මක වෙමින් පවතී. • ත්‍රී රෝද රථ රියදුරු සංගමය • දේශීය ගෘහ සේවක සේවිකාවන් • විදුලි කාර්මික ශිල්පීන් • පෙර පාසල් ගුරු • බස් රථ රියදුරු කෝන්දොස්තර වෘත්තිකයින් • මේසන්, වඩු හා ටයිල් බාස්වරු
09	LEED+ “Capacity building of DME staff for Scaling Up at National Level and Replication of the Model in the Eastern Province for inclusive job placement’’ – (ILO)	ආබාධිත පුද්ගලයින් රැකියාගත කිරීම පිළිබඳව මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ ධාරිතාව වර්ධනය කිරීම සහ එමගින් ආබාධ සහිත පුද්ගලයින් ජාතික මට්ටමින් ආර්ථිකයට සහභාගීකර ගැනීමට නැගෙනහිර පළාතේ ආබාධිත පුද්ගලයින් රැකියාගත කිරීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම මෙම වැඩසටහනෙහි අරමුණ විය. ත්‍රිකුණාමලය, අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්කවල ආබාධිත ප්‍රතිලාභීන් 900ක් ඉලක්ක කර වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

2.1.5 මහජන රැකියා සේවා අංශය - 2023 වර්ෂයේ ප්‍රගතිය

(i) **<u>2023 වර්ෂයේ මහජන රැකියා සේවා අංශය (PES) මඟින් ඉටුකරනු ලැබූ කාර්යයන්</u>**

- මහජන රැකියා සේවා අංශයේ මූලිකත්වයෙන් 2023 මැයි මාසයේ සිට මාර්ගගත ක්‍රමයට රැකියා සපයන ආයතන ලියාපදිංචි කර ගැනීම ආරම්භ කිරීම සහ ඒ අනුව පුද්ගලික ආයතන 62ක් ලියාපදිංචි කර ගැනීම සහ එම ආයතනවල පවත්නා පුරප්පාඩු ලබාගැනීම.
- දිස්ත්‍රික් Whatsapp සමූහ හරහා එම රැකියා පුරප්පාඩු ප්‍රචාරණය , එම සමූහ හරහාම Google පෝරම භාවිතයෙන් රැකියා ඉල්ලුම්පත්‍ර භාර ගැනීම සහ ඉල්ලුම් පත්‍ර අදාළ ලියාපදිංචි පුද්ගලික ආයතන වෙත යොමු කිරීම.
- දිස්ත්‍රික්කය තුළ රැකියා අපේක්ෂිතයින් පිළිබඳ සංඛ්‍යා ලේඛන රැස්කිරීමට හා විශ්ලේෂණය කිරීමට හැකිවන පරිදි දිස්ත්‍රික 25 හි Google පෝරම 25 ක් හරහා රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කිරීම (98739 ක්).
- ප්‍රධාන කාර්යාලයේ මහජන රැකියා සේවා අංශය විසින් සති අන්ත පුවත්පත් වන සිළුමිණ, ලංකාදීප, Sunday Observer, වීරකේසරී (දමිළ), සහ තිනකරන් යන පුවත්පත් මිළදී ගෙන එම පුවත්පත්වල පළවන රැකියා ඇබෑර්තු දිස්ත්‍රික්ක මට්ටමින් පවතින දෙපාර්තමේන්තු Whatsapp සමූහය සහ රැකියා අපේක්ෂිත සමූහය වෙත යොමුකර, පවතින රැකියා පුරප්පාඩු පිළිබඳව රැකියා අපේක්ෂිතයින් දැනුවත් කිරීම. 2023 වර්ෂයේ ඉහත සඳහන් පුවත්පත් වල පළ වූ මුළු රැකියා ඇබෑර්තු සංඛ්‍යාව 5159 කි.
- ජනාධිපති කාර්යාලය මඟින් යොමුකරන ලද රැකියා ඉල්ලීම් 620 ක් පුද්ගලික අංශයේ රැකියා අවස්ථා සඳහා යොමුකිරීමට අදාල දිස්ත්‍රික් මහජන රැකියා සේවා මධ්‍යස්ථාන වෙත යොමුකිරීමට කටයුතු කළ අතර, එහි ප්‍රගතිය ජනාධිපති කාර්යාලය වෙත ලබාදීමට කටයුතු කිරීම.
- අගමැති කාර්යාලය මගින් යොමුකරන ලද රැකියා ඉල්ලීම් 08ක් පුද්ගලික අංශයේ රැකියා අවස්ථා ලබාදීම සඳහා අදාල දිස්ත්‍රික් මහජන රැකියා සේවා මධ්‍යස්ථාන වෙත යොමුකිරීමට කටයුතු කළ අතර, එහි ප්‍රගතිය අගමැති කාර්යාලය වෙත ලබාදීමට කටයුතු කිරීම.
- බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් අප දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් බස්නාහිර පළාත් රැකියා අපේක්ෂිත පුද්ගලයින් දේශීය/විදේශීය රැකියා සඳහා යොමුකරවීමේ අරමුණ ඇතිව පුද්ගලික ආයතන, පුහුණු ආයතන සහභාගීත්වයෙන් විශේෂ රැකියාපොළ/වෘත්තීයපොළ වැඩසටහනක් 2023/06/06 වන දින බත්තරමුල්ල දියත පරිශ්‍රයේදී පැවැත්වීමට කටයුතු කිරීම.
- කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහයෝගයෙන් Glocal Fair 2023 විශේෂ ජංගම සේවා වැඩසටහන

2023/07/15 සහ 16 යන දිනයන්හි යාපනය දිස්ත්‍රික්කයේ මුට්ටවේලී ක්‍රීඩාංගනයේදී පැවැත්වීම.

- දිස්ත්‍රික් මහජන රැකියා සේවා මධ්‍යස්ථාන සමඟ සම්බන්ධ වන පාසැල් සිසුන්, පාසැල් හැරගිය සිසුන් සහ රැකියා අපේක්ෂිතයින් වෙත දිස්ත්‍රික්කයට අදාළ අධ්‍යාපන හා ආර්ථික පසුබිම පිළිබඳව දැනුවත් කිරීම සඳහා දිස්ත්‍රික්ක 13ක දිස්ත්‍රික් මාධ්‍ය ඒකක සමඟ සම්බන්ධ වී විඩියෝපට 13ක් සකස් කිරීම.

(ii) දිස්ත්‍රික් රැකියා පොළ සහ ප්‍රාදේශීය රැකියා පොළ ප්‍රගතිය - 2023

අනු අංකය	වැඩසටහන	වැඩසටහන් ගණන	සහභාගී වූ පුද්ගලික ආයතන සංඛ්‍යාව	සහභාගී වූ රැකියා අපේක්ෂිතයින් සංඛ්‍යාව	සහභාගී වූ දෙමාපියන් සංඛ්‍යාව හා වෙනත්	රැකියා සඳහා යොමුකළ සංඛ්‍යාව	රැකියා ගත කිරීමේ සංඛ්‍යාව
01	දිස්ත්‍රික් රැකියාපොළ වැඩසටහන් (සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි)	28	896	16,431	1,362	15,664	1,521
02	ප්‍රාදේශීය රැකියාපොළ වැඩසටහන් (ප්‍රාදේශීය ලේකම් කාර්යාල 200 ආවරණය වන පරිදි)	203	2,488	33,775	2,482	27,405	4,811
	මුළු ගණන	231	3,384	50,216	3,844	43,069	6,332

(iii) දිස්ත්‍රික් වෘත්තීය පොළ වැඩසටහන් ප්‍රගතිය - **2023**

අනු අංකය	වැඩසටහන	වැඩසටහන් ගණන	සහභාගී වූ පුහුණු ආයතන ගණන	සහභාගී වූ පුහුණු අපේක්ෂිතයින් සංඛ්‍යාව	සහභාගී වූ දෙමාපියන් සංඛ්‍යාව හා වෙනත්	පුහුණු සඳහා යොමුකළ සංඛ්‍යාව
01	දිස්ත්‍රික් වෘත්තීයපොළ වැඩසටහන් (සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි)	50	465	12,128	1,653	3,694

(iv) විශේෂ රැකියාපොළ / වෘත්තීය පොළ වැඩසටහන් ප්‍රගතිය - 2023

අනු අංකය	වැඩසටහන	ස්ථානය සහ දිනය	වැඩසටහන් ගණන	සහභාගී වූ පුද්ගලික ආයතන හා පුහුණු ආයතන සංඛ්‍යාව	සහභාගී වූ රැකියා අපේක්ෂිතයින් සංඛ්‍යාව	රැකියා සඳහා යොමුකළ සංඛ්‍යාව	රැකියාගත කිරීමේ සංඛ්‍යාව
01	බස්නාහිර පළාත් සභාවේ මෙහෙයවීමෙන් සිදුකරනලද රැකියාපොළ/ වෘත්තීය පොළ වැඩසටහන	බත්තරමුල්ල දියත පරිශ්‍රය 2023/06/06	01	පුද්ගලික ආයතන - 27 පුහුණු ආයතන - 35	470	144	35
02	Glocal Fair 2023 යාපනය දිස්ත්‍රික්කය	යාපනය මුට්ටවේලී ක්‍රීඩාංගනයේදී 2023/07/15 සහ 16	01	12	188	148 භෞතික- 86 මාර්ගගතව- 62	10

2.2. සමස්ථ රැකියා ගත කිරීම් - 2023.12.31 දිනට

ඉහත දිස්ත්‍රික් රැකියාපොළ වැඩසටහන්, ප්‍රාදේශීය රැකියාපොළ වැඩසටහන් ප්‍රධාන කාර්යාලයේ මහජන රැකියා සේවය යටතේ රැකියාගත කිරීම් හා නිලධාරීන් විසින් පෞද්ගලිකව යොමුකරන ලද රැකියාගත කිරීම් යන ක්‍රමවේදයන් ඔස්සේ වර්ෂය තුළ සමස්ථ රැකියාගත කිරීම් සංඛ්‍යාව 14015 කි. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ රැකියාපොළ වැඩසටහන් මඟින් සිදුකළ රැකියාගත කිරීම් ප්‍රමාණය 6332 ක් වන අතර, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කාර්යාල වෙත පැමිණි සේවාලාභීන් හා ජාතික මට්ටමින් දෙපාර්තමේන්තුව මඟින් රැකියාගත කිරීම් සඳහා දිස්ත්‍රික් කාර්යාල වෙත යොමුකළ රැකියාගත කිරීම් යන රැකියාගත කිරීම්හි එකතුව 7683 කි. ඒ අනුව සමස්ථ රැකියාගත කිරීම් ප්‍රමාණය 14015 කි. රැකියාගත වූවන්ගේ සේවාලද දිස්ත්‍රික්කය අනුව වාර්තා කොට පහත දැක්වේ.

සමස්ථ රැකියා ගත කිරීම් - 2023.12.31 දිනට

	දිස්ත්‍රික්කය	රැකියා ගත කිරීම්	ස්වයං රැකියාලාභීන්/ව්‍යවසායකයින් බිහි කිරීම
1	කොළඹ	**924**	**102**
2	ගම්පහ	**288**	**47**
3	කළුතර	**699**	**92**
4	මහනුවර	**986**	**185**
5	මාතලේ	**750**	**133**
6	නුවරඑළිය	**437**	**111**
7	ගාල්ල	**733**	**283**
8	මාතර	**950**	**508**
9	හම්බන්තොට	**660**	**140**
10	යාපනය	**953**	**464**
11	මන්නාරම	**425**	**200**
12	වවුනියාව	**263**	**113**
13	මුලතිව්	**3**	**17**
14	කිලිනොච්චිය	**250**	**85**
15	මඩකලපුව	**345**	**269**
16	අම්පාර	**315**	**663**
17	ත්‍රිකුණාමලය	**139**	**15**
18	කුරුණෑගල	**1,339**	**280**
19	පුත්තලම	**100**	**163**
20	අනුරාධපුරය	**536**	**33**
21	පොළොන්නරුව	**128**	**86**
22	බදුල්ල	**1,171**	**100**
23	මොණරාගල	**291**	**61**
24	රත්නපුර	**656**	**176**
25	කෑගල්ල	**673**	**139**
	එකතුව	**14,015**	**4,465**

මිහින්තලේ ප්‍රාදේශීය රැකියා පොළ - 2023/08/10





මාතර දිස්ත්‍රික් රැකියාපොළ - 2023/09/08





සියඹලාණ්ඩුව ප්‍රාදේශීය රැකියාපොළ - 2023/09/10





බස්නාහිර පළාත් සභාවේ මූලිකත්වයෙන් බස්නාහිර පළාත් රැකියා අපේක්ෂිත පුද්ගලයින්ට දේශීය/විදේශීය රැකියා සහ පුහුණු පාඨමාලා සඳහා යොමුකිරීමේ රැකියාපොළ වැඩසටහන - 2023/06/06 - බත්තරමුල්ල දියත පරිශ්‍රයේදී




කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් යාපනය මුට්ටවේලී ක්‍රීඩාංගනයේදී පැවති Glocal Fair -2023 වැඩසටහන - 2023/07/15 සහ 16







2.3 භෞතික හා මූල්‍ය ප්‍රගති සාරාංශය - 2023.12.31 දිනට

	වැඩසටහන /ක්‍රියාකාරකම	භෞතික			මූල්‍ය			ප්‍රතිලාභීන්
		ඉලක්කය	ප්‍රගතිය	ප්‍රතිශතය	ඉලක්කය	ප්‍රගතිය	ප්‍රතිශතය	
1	ශ්‍රම වෙළඳපොලට වඩාත් ගැලපෙන රැකියා යෝග්‍ය කුසලතා වලින් යුත් මානව සම්පතක් බිහි කිරීම							
	දිස්ත්‍රික් රැකියා පොළ පැවැත්වීම	25	28	112.00%	3.500	3.360	96.00%	16,822
	දිස්ත්‍රික් වෘත්තීය පොළ පැවැත්වීම	25	35	140.00%				10,495
	ප්‍රාදේශීය රැකියා පොළ පැවැත්වීම	200	203	101.50%				33,775
	ප්‍රවර්ධන වීඩියෝපට සැකසීම	6	13	216.67%	0.500	0.492	98.40%	
2	ශ්‍රම වෙළඳපොල තොරතුරු පර්යේෂණ							
	Case studies on Success Cases	7	4	57.14%	0.209	0.209	100.00%	
	Policy Sessions on LMI issues	3	3	100.00%	0.065	0.065	100.00%	
	Individual Study Reports 7	100%	90%	90%	0.226	0.155	68.58%	
3	වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් පැවැත්වීම							
	9 වසර සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් පැවැත්වීම	1,200	1,791	149.25%	5.400	2.282	42.26%	55,362
	අ.පො.ස සාමාන්‍ය පෙළ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන	1,200	2,685	223.75%				72,049
	අ.පො.ස උසස් පෙළ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන	1,200	1,339	111.58%				38,259
	වෘත්තීය මාර්ගෝපදේශ සතිය	300	212	70.67%	3.900	6.305	161.67%	10,318
	ප්‍රවර්ධන වීඩියෝපට සැකසීම	8	8	100.00%	0.800	0.793	99.13%	
4	මහජන රැකියා සේවය							
	රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කිරීම	120,000	98,739	82.28%				98,739
	රැකියා ඇබෑර්තු ලියාපදිංචි කිරීම	45,000	51,348	114.11%				51,348
	රැකියා අපේක්ෂිතයන් රැකියා සඳහා යොමු කිරීම	90,000	84,776	94.20%				84,776

	රැකියා අපේක්ෂිතයන් රැකියා ගත කිරීම	20,000	14,015	70.08%				14,015
	වෘත්තීය මාර්ගෝපදේශ සේවා සැපයීම	30,000	65,198	217.33%				65,198
	පුහුණුව සඳහා යොමු කිරීම	18,000	26,093	144.96%				26,093
	News papers to National PES Center And Vacancy Advertisement Dissamination	100%	100%	100%	0.060	0.037	61.67%	4932 Newspapers Vacancies Distributed
	Enhancing the PES delivary system	100%	100%	100%	0.400	0.130	32.50%	
	<u>උතුරු පළාත් රැකියාගත කිරීමේ වැඩසටහන</u>							
	රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කිරීම	10,000	8,829	88.29%				8,829
	රැකියා අපේක්ෂිතයන් රැකියාගත කිරීම	3,000	1,894	63.13%				1,894
	පුහුණුව සඳහා යොමු කිරීම	3,000	3,218	107.27%				3,218
	On the Job Training	250	126	50.40%				126
	Directed to the RPL	500	536	107.20%				536
5	<u>ක්‍රියාකාරී ශ්‍රම වෙළඳපොලක් සඳහා අභ්‍යන්තර කලමණාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම</u>							
	Procorns (Department Website)	100%	100%	100%	0.800	0.772	96.50%	
	Web Site Development	100%	70%	70%				
	Awereness Programe	100%	100%	100%				
6	<u>නැගෙනහිර පළාත් ආබාධිත පුද්ගලයන් රැකියා ගත කිරීමේ වැඩසටහන</u>							
	ව්‍යාපාර ආයතන	200	160	80%	10.600	10.021	94.54%	160
	ප්‍රතිලාභීන්	900	903	100%				903
	රැකියා පොළ සඳහා ප්‍රතිලාභීන්	200	196	98%				196
	රැකියාගත කිරීම්		44					44
7	එකතුව (මූල්‍ය)				26.460	24.621	93.04%	

ඉදිරි ඉලක්ක -:

1. ශ්‍රී ලංකාවේ රැකියාවක, අධ්‍යාපන කටයුත්තක හෝ පුහුණුවක නිරත නොවන තරුණ ජනගහනය සක්‍රීය ශ්‍රමබලකායට එකතුකර ගැනීම අරමුණු කරගනිමින් දිස්ත්‍රික්ක 25 හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 80 ක් ආවරණය වන පරිදි සමීක්ෂණය කිරීම ((NEET Group Survey). අනතුරුව ඔවුන් සක්‍රීය ශ්‍රම බලකායට දායක කරගැනීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

2. Glocal Fair වැසටහනට සමගාමීව දිස්ත්‍රික්ක මට්ටමින් අවිධිමත් අංශයේ ශ්‍රමිකයින්ට "ගරුසරු"සංකල්පය හඳුන්වා දීමේ වැඩසටහන් පැවැත්වීම. එම දැනුවත් කිරීමේ වැඩසටහන් 2024 අගෝස්තු මාසය වන විට අවසන් කිරීමට අපේක්ෂිතය. තවද අවිධිමත් අංශයේ හඳුනාගත් ක්ෂේත්‍ර වල ආංශික උපකමිටු පිහිටුවා එම ක්ෂේත්‍ර වල ජාතික වෘත්තීය මණ්ඩල පිහිටුවා අදාල ව්‍යවස්ථා කෙටුම්පත් කිරීම.

3. ශ්‍රී ලංකාව 2048 වර්ෂය වන විට සංවර්ධිත රටක් බවට පත්කිරීමේ රාජ්‍ය අරමුණ සාක්ෂාත් කරගැනීමට, සිසුන් සතු විභවතා හඳුනා ගනිමින්, වැඩ ලෝකය හඳුනා ගැනීමට අවස්ථාව සලසමින් සුදුසු රැකියා ක්ෂේත්‍රයක් තෝරා ගෙන ඒ සඳහා සුදානම් වීමට, එයට පිවිසීමට හා ඒ තුළ සංවර්ධනය වෙමින් රටේ ජාතික නිෂ්පාදිතයට දායකත්වය සැපයීමට සුදානම් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ලබා දෙන සියලුම රජයේ පාසල් වල ඉගෙනුම ලබන 9 ශ්‍රේණිය, අ.පොෙ.ස සාමාන්‍ය පෙළ හා අ.පොෙ.ස උසස් පෙළ ශ්‍රේණි වල ඉගෙනුම ලබන සියලුම පාසල් සිසුන් ආවරණය වන පරිදි වෘත්තීය මාර්ගෝපදේශය පිළිබඳව දැනුවත් කිරීම (Career Awarness).

4. SMART YOUTH CLUBS වැඩසටහන අනාගත අභියෝගවලට ඵලදායි ලෙස මුහුණ දීම සඳහා නායකත්වයෙන්, නිර්මාණශීලීත්වයෙන් හෙබි ශක්තිමත් තරුණ කණ්ඩායමක් සෑම ග්‍රාමයකම පිහිටුවීම තුළින් ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති පරතරය අවම කිරීම. මෙම වැඩසටහන 2024 වර්ෂයේ නියමු ව්‍යාපෘතියක් ලෙස තෝරා ගත් දිස්ත්‍රික්ක තුනක ක්‍රියාත්මක කිරීමට නියමිතය.

5. 2024 වර්ෂය තුළදී අවම වශයෙන් 30,000 ක රැකියා අපේක්ෂිතයන් සුහුරු ශ්‍රමිකයන් වශයෙන් දේශීය හා විදේශීය ශ්‍රම වෙළඳපොළ වෙත යොමු කිරීමට අවශ්‍ය වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කිරීම.

6. ව්‍යවසායකත්ව පුහුණුව හා සංවර්ධනය වඩාත් විධිමත් හා ඉලක්කගත ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට 2024 වර්ෂයේ සිට සැලසුම් කර ඇත. තෝරාගන්නා ව්‍යවසායකත්ව පෞරුෂය සහිත කණ්ඩායමක් සමඟ අඛණ්ඩව වර්ෂ 3-5 අතර කාලයක් කටයුතු කරමින් ව්‍යවසායකත්ව සංවර්ධන නව මොඩියුලයක් අනුව කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ.

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

කේ.ජී.එච්.එච්.ආර්.කිරිඇල්ල
අධ්‍යක්ෂ ජනරාල්
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

කේ.ජී.එච්.එච්.ආර්. කිරිඇල්ල
අධ්‍යක්ෂ ජනරාල්
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
09 වන මහල, "සෙත්සිරිපාය", දෙවන අදියර
බත්තරමුල්ල.

03

පරිච්ඡේදය

වසරේ සමස්ථ
මූල්‍ය කාර්යසාධනය

3. පරිච්ඡේදය - 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්යසාධනය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - 2023.12.31 දිනෙන් අවසන් වූ කාලසීමාව සඳහා

										ඒසිඒ-එෆ්
2023 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා										
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය										
සංශෝධිත අයවැය ප්‍රතිපාදන **2023**				සටහන		තත්‍ය				
						වර්තමාන වර්ෂය **2023**		ඉකුත් වර්ෂය **2022**		
රු.						රු.		රු.		
-		**ආදායම් ලැබීම්**				-		-		
-		ආදායම් බදු		**1**		-		-		ඒසිඒ-1
-		දේශීය භාණ්ඩ හා සේවා මත බදු		**2**		-		-		
-		ජාත්‍යන්තර වෙළඳාම මත බදු		**3**		-		-		
-		බදු නොවන ආදායම් හා වෙනත්		**4**		-		-		
-		**මුළු ආදායම් ලැබීම් (අ)**				-		-		
-		**ආදායම් නොවන ලැබීම්**				-		-		
-		භාණ්ඩාගාර අග්‍රිම				502,029,815		490,126,000		**ඒසිඒ-3**
-		තැන්පතු				285,572		1,535,395		**ඒසිඒ-4**
-		අත්තිකාරම් ගිණුම්				20,384,844		16,622,102		**ඒසිඒ-5**
		වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්				-		-		
-		**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**				**522,700,231**		508,283,497		
-		**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**				**522,700,231**		508,283,497		
		භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)				-		1,467,537		
		ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)				522,700,231		506,815,960		

		අඩු කළා : වියදම්							
-		**පුනරාවර්තන වියදම්**				-		-	
445,400,000		වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ		**5**		441,108,248		416,327,772	
93,512,400		අනෙකුත් භාණ්ඩ හා සේවා		**6**		86,033,568		76,155,088	**ඒසිඒ-2(ii)**
9,300,000		සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්		**7**		6,209,792		6,992,689	
-		පොළී ගෙවීම්		**8**		-		-	
-		වෙනත් පුනරාවර්තන වියදම්		**9**		-		-	
548,212,400		**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**				**533,351,608**		499,475,549	
		මූලධන වියදම්							
3,937,600		මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්		**10**		3,616,871		1,452,800	
2,850,000		මූලධන වත්කම් අත්පත් කර ගැනීම්		**11**		2,688,962		867,010	
-		ප්‍රාග්ධන මාරුකිරීම්		**12**				-	**ඒසිඒ-2(ii)**
-		මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම		**13**		2,489,726		-	
2,500,000		හැකියා වර්ධනය		**14**				1,809,797	
27,000,000		වෙනත් මූලධන වියදම්		**15**		25,357,631		16,609,268	
36,287,600		**මුළු මූලධන වියදම් (උ)**				**34,153,190**		20,738,875	
		තැන්පතු ගෙවීම්				465,286		1,194,892	**ඒසිඒ-4**
		අත්තිකාරම් ගෙවීම්				32,161,863		32,031,202	**ඒසිඒ-5**
		වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්				-		-	
		ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)				32,627,149		33,226,094	
		මුළු වියදම් එ = (ඊ+උ+ඌ)				600,131,947		553,440,518	
-		**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**				(77,431,716)		(46,624,558)	
		අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය				(77,431,716)		(46,624,558)	**ඒසිඒ-7**
		දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				-		-	**ඒසිඒ-3**
						-		-	

3.2. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

						ඒසීඒ-පී
2023 දෙසැම්බර් **31** දිනට						
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය						
				තත්‍ය		
		සටහන		**2023**		**2022**
		-	-	රු.		රු.
මූල්‍ය නොවන වත්කම්						
දේපළ, පිරියත හා උපකරණ		ඒසීඒ-6		140,981,909		140,171,764
මූල්‍ය වත්කම්						
අත්තිකාරම් ගිණුම්		ඒසීඒ-5/5(ඒ)		66,196,731		54,419,712
මුදල් හා මුදල් සමාන දෑ		ඒසීඒ-3		-		-
මුළු වත්කම්				**207,178,640**		**194,591,476**
ශුද්ධ වත්කම් / ස්කන්ධය						
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්				65,844,041		53,887,309
දේපළ පිරියත හා උපකරණ සංචිතය				140,981,909		140,171,764
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය		**ඒසීඒ-5(බී)**				
ජංගම වගකීම්						
තැන්පතු ගිණුම්		ඒසීඒ-4		352,690		532,406
අග්‍රිම ශේෂය		ඒසීඒ-3		-		-
මුළු වගකීම්				**207,178,640**		**194,591,476**

පිටු අංක 1 සිට 25 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 26 සිට 52 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදිරිව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 2024.04.26	දිනය :	දිනය :
ආර් පී ඒ [illegible]	කේ.පී.එච්.එච්.ආර්. කිරිඇල්ල	ඒ. මෙහෙනරාජ්
ලේකම්	අධ්‍යක්ෂ ජනරාල්	ප්‍රධාන ගණකාධිකාරි
කම්කරු හා [illegible]	මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව	මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
7 වන මහල, [illegible]	වත මගල. "සෙත්සිරිපාය", දෙවන අදියර	
නාරාහේන්පිට, [illegible]	බත්තරමුල්ල.	

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

		ඒසීඒ-සී
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය		
	තත්‍ය	
	2023	**2022**
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	34,113,099	25,325,007
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	502,029,815	490,126,000
අත්තිකාරම් අයකර ගැනීම්	20,511,481	16,383,833
තැන්පතු ලැබීම්	285,572	1,535,395
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**556,939,967**	**533,370,235**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	504,564,968	474,089,275
සහනාධාර සහ මාරුකිරීම්	6,037,294	6,992,689
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	653,040	1,337,073
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	1,467,537
අත්තිකාරම් ගෙවීම්	32,161,863	32,169,146
තැන්පතු ගෙවීම්	465,285	1,194,891
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**543,882,450**	**517,250,611**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**13,057,517**	**16,119,624**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී		

	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**-**	**-**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	13,057,517	16,119,624
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**13,057,517**	**16,119,624**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(13,057,517)**	**(16,119,624)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**-**	**-**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.4 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
අදාල නොවේ.					

3.5 වෙන් කරන ලද ප්‍රතිපාදන (පවතීනම්)උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

රු.000

ප්‍රතිපාදන වර්ගය	වෙන්කරන ලද ප්‍රතිපාදන		නිදහස් වියදම	උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	549,000	548,212.4	533,351.6	97
ප්‍රාග්ධන	34,000	36,287.6	34,153.1	94

3.6 මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

පරිත්‍යාග කළ ආයතනය	පරිත්‍යාගයේ අරමුණ	පරිත්‍යාග මුදල
අදාල නොවේ.		

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2023 දිනට භාණ්ඩ සම්ක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2023 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්				
9152	යන්ත්‍රෝපකරණ	140,981	140,981		100
9153	ඉඩම්				
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරිගෙන යන වැඩ				
9180	බදු දෙනලද වත්කම්				

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } LSW/B/MP/SR/01/2023 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2024 මැයි ෧෦ දින

ගණන්දීමේ නිලධාරි
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

ශීර්ෂය 328 - මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 328 - මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 09 දින නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම් යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක්

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ආ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමට අදාලව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 05/2023 දරණ උපදෙස් මාලාවේ 8.2 වගන්තිය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් නිඛේනම් ඒවා නිසි පරිදි හඳුනාගෙන පිරිවැයට හෝ පිරිවැය හඳුනාගත නොහැකි අවස්ථාවලදී තක්සේරු කල අගයට ගිණුම්ගත කලයුතු වුවද, 2023 වර්ෂයේ දෙපාර්තමේන්තුව නමට ලියාපදිංචි කරන ලද මිනි වෑන් රථයේ අගය හඳුනාගෙන නොතිබූ අතර ලියාපදිංචිය සඳහා වැයවූ රු.1,500,000 පමණක් සිගාස් වැඩසටහන තුල වාර්තා කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

මූලධන වැය විෂයන් 3 න ඉතිරි ප්‍රතිපාදන භාවිතා කර 2023 දෙසැම්බර් 28 දින රු.548,435 ක් වැය කර කැමරාවක් හා උපාංග ද, රු.352,000 ක් වැය කර ලැප්ටොප් පරිගණකයක්ද මිලදී ගෙන නිබූ අතර, 2023 වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම තුල මෙම ප්‍රසම්පාදනයන් ඇතුලත්ව නොතිබුණි. ප්‍රසම්පාදන අවශ්‍යතාව පිළිබඳ අනුමත සැලැස්මෙහි සංශෝධනයක්ද සිදුකර නොතිබුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 01 ඡේදය පරිදි 2017 වර්ෂයේ සිට වාර්ෂික විසර්ජන පනත මගින් සලසා දෙනු ලබන ප්‍රතිපාදන ප්‍රශස්ථ මට්ටමින් උපයෝජනය හා අනුමත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැඳීම් හා බැරකම්වලට නොඑළඹිය යුතු වුවද 328-1-1-0-1404 වැය විෂයය යටතේ ප්‍රතිපාදන ඉක්මවා රු.5,829,089 ක බැරකමක් සඳහා එළඹ තිබුණි.

2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

2.4 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මු.රෙ.104 (i)	පාඩුවක් හෝ අලාභ හානියක් සිදුවූ විභාග එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැන ගැනීමටත්. එයට වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහාත් පරීක්ෂණ ආරම්භ කල යුතු වුවත් දෙපාර්තමේන්තුවට අයත් වාහන දෙකක් සම්බන්ධ විත වර්ෂයේදී අනතුරුවලට ලක්වී ඇතත් අදාල රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ii) මු.රෙ.880	රජයේ මුදල්, ආදායම් හෝ බඩු බාහිරාදිය භාරගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදාහැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති නිලධාරීන්ද, රජයේ ගිණුම්ට අදාල විවුවර සහතික කරන, චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටුකරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනත අනුව ඇප තැබිය යුතු වුවද, දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ එවැනි ඇප තැබීමක් නිරීක්ෂණය නොවීය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 දැක්ම හා මෙහෙවර

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍ර අංක 1640/31 අනුව මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව පිහිටුවීමේ එක් අරමුණක් වන ජාතික මිනිස් බල ප්‍රතිපත්තිය සකස් කර ක්‍රියාත්මක කිරීම සිදුකල යුතු වුවද, එකී අරමුණු 2023 වර්ෂය වන විටත් ඉටුකර ගැනීමට නොහැකිව පැවතුණි. 2015 වර්ෂයේදී සකස් කරන ලද ප්‍රතිපත්ති රාමුව සම්පාදනය කර වසර 05 කට අධික කාලයක් ඉක්මවා ගොස් ඇති බැවින් එය නැවත සංශෝධනය කර ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපත්තියක් නිරීක්ෂණය නොවිය.

3.1.2 සැලසුම් කිරීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුල නිරූපණය නොවූ "ගරුසරු" නමින් වැඩසටහනක් 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබූ අතර, මෙම වැඩසටහන සඳහා පුවත්පත් දැන්වීම් පලකිරීමට රු.342,456 ක් වැය දරා තිබුණි.

(ආ) 2023 වර්ෂයේ අනුමත ප්‍රසම්පාදන සැලැස්මට පරිබාහිරව රු.548,435 ක් වැයකර වීඩියෝ කැමරාවක් හා උපාංගද, රු.352,500 ක් වටිනාකමක් සහිත ලැප්ටොප් පරිගණකයක්ද මිලදිගෙන තිබුණි. මෙකී ප්‍රසම්පාදන කාර්යයන් සැලසුම් සහගතව සිදුකර නොතිබූ අතර 2023 දෙසැම්බර් 28 දින මුදල් ගෙවා තිබුණද, ප්‍රසම්පාදන අත්පොතේ 4 පරිච්ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම වරින්වර පරීක්ෂා කර බලා සමාලෝචනය කිරීමක් සිදුකර නොතිබුණි.

3.1.3 කාර්යභාරයන් ඉටු නොකිරීම

ශ්‍රම වෙළඳපොලට වඩාත් ගැලපෙන යෝග්‍ය කුසලතාවලින් යුතු මානව සම්පතක් බිහිකිරීමේ වැය විෂය යටතේ ප්‍රවර්ධන වීඩියෝ වැඩසටහන් 13 ක් නිර්මාණයට හා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් සඳහා ප්‍රවර්ධන වීඩියෝපට 6 ක් නිර්මාණය සඳහා රු.859,935 ක් වැය කර තිබුණද එකී කාර්යයන් අවසන්ව නොතිබුණි.

3.1.4 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) දෙපාර්තමේන්තුවේ කාර්යයන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටුකිරීමේ අරමුණින්, අභ්‍යන්තර කළමනාකරණ තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීමට 2021 වර්ෂයේදී පෞද්ගලික සමාගමක් සමඟ ඇති කරගෙන තිබූ එකඟතාවය පරිදි පළමු අදියර සඳහා රු.2,060,615 ක් ගෙවීම් කර තිබුණි. මෙම පද්ධතිය මගින් වැඩසටහන් සැලසුම් කිරීම, කාර්මික වෙළඳපල තොරතුරු සකස් කිරීම, නිවාඩු ලේඛන සැකසීම, පුහුණු කටයුතු හා ස්ථානමාරු කළමනාකරණය යන අංශ සිදුකිරීමට නියමිතව තිබුණද, සේවකයන්ගේ පුද්ගලික ලිපිගොනු තොරතුරු පමණක් පද්ධතිය තුල පැවති අතර

අනෙකුත් අපේක්ෂිත තොරතුරු මෙහෙයුම් පද්ධතිය හරහා සිදුවන බවට තහවුරු නොවිය.

(ආ) මහජනතාවට තොරතුරු සන්නිවේදනය වන හා තොරතුරු රැස්කිරීමේ වැදගත් කාර්යභාරයක් ඉටුකිරීමේ අරමුණින් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය නිර්මාණය සඳහා පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුම්ගතවී තිබූ අතර, ශ්‍රම වෙළඳපොල තොරතුරු, වෘත්තීය මාර්ගෝපදේශ තොරතුරු සහ රැකියා අපේක්ෂක යනුවෙන් නිරූපන පහසුකම් තුනක් ලබාගෙන තිබූ නමුත් තාක්ෂණික දෝෂ හේතුවෙන් 2022 අග භාගයේදී රැකියා අපේක්ෂක පද්ධතිය ලියාපදිංචිවීම නතර වී පැවතුණි. විගණන අවස්ථාව වන විට රැකියා සේවා මධ්‍යස්ථාන නිරූපණය (icon) පමණක් පැවති අතර, ඉතිරි නිරූපණ අක්‍රීය කර තිබූ අතර වෙබ් අඩවියේ නඩත්තු කාර්යය සඳහා මාස 6 කට වරක් රු.175,000 ක් වැය දරා තිබුණි. 2023 වර්ෂයේ නොවැම්බර් මස සිට නිරූපන දෙකක් අක්‍රීය වී තිබූ බැවින් රු.90,000 ක මුදලකට නැවත ගිවිසුම් ගත වී තිබුණද. අදාල පද්ධතිය අපේක්ෂිත පරිදි ඉටුවී නොතිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

දෙපාර්තමේන්තුවට අයත් ජීප් රථයක් 2023 මැයි 11 දින අසිවෙගි මාර්ගයේදී රේඩියේටරයේ උඩ බාර් කොටස පුපුරා යාම නිසා තලවතුගොඩ ප්‍රදේශයේ ගරාජයකට අලුත්වැඩියාව සඳහා යොමුකර තිබුණි. අදාල ගරාජය 2023 මැයි 25 දින අලුත්වැඩියාව සඳහා රු.1,551,000 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබූ අතර අදාල මිල ගණන් හා අලුත්වැඩියාවන් එම ආයතනයෙන් කර ගැනීමට සුදුසු බවට යාන්ත්‍රික ඉංජිනේරු වරයාගේ නිර්දේශය ලබාදීමට මාස තුනක කාල පමාවකින් සිදුවී තිබුණි. රේඩියේටර් උඩ බාර් කොටස පුපුරා යාම නිසා සිදු වූ හානියක් වාර්තා වී තිබූ අතර, එම හානිය මඟින් වාර්තා වී නොතිබූ කාර්යන් සඳහා එකී සියලු අමතර කොටස් යොදා අලුත්වැඩියාව සිදු කිරීම කර තිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) දෙපාර්තමේන්තුව විසින් රු.398,000 කට ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් මිලදී ගෙන තිබූ අහල් 55" රූපවාහිනී යන්ත්‍ර දෙකක් දෙපාර්තමේන්තුවේ A හා B කලාප දෙකෙහි රු.54,704 ක් වැයකර ස්ථාපිත කර තිබුණද ඵලදායී ලෙස භාවිතයකින් තොරව පැවතුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ මහජන රැකියා සේවා අංශය විසින් පවත්වන රැකියා පොළ, වෘත්තීය පොළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඒ සම්බන්ධ වීඩියෝ පට සැකසීම, වෙබ් අඩවියේ පළකිරීම, ෆේස්බුක් පිටුවේ පලකිරීම සඳහා රු.548,435 ක් වැයකර කැමරාවක් හා උපාංග මිලදී ගෙන තිබුණි. 2022 වර්ෂයේදී මෙකී අවශ්‍යතා සඳහා රු.5,228,193 ක් වැයකර කැමරා 30 මිලදී ගෙන තිබූ නමුත් වීඩියෝ නිර්මාණ සැකසීම සඳහා 2023 වර්ෂයේදීද බාහිර ආයතන සඳහා රු.859,935 ක් ගෙවා තිබුණි.

3.4 අනාවරණය කළ ගණුදෙනු

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන යන ගොඩනැගිල්ල සඳහා නාගරික සංවර්ධන හා ආයෝජන පුද්ගලික සමාගමට මාසිකව රු.3,548,342 ක කල්බදු වාරිකයක් බැගින් වාර්ෂිකව රු.42,580,104 ක පිරිවැයක් ගෙවීමට සිදුව ඇති අතර, අමාත්‍යාංශය සමඟ කටයුතු කිරීම හා පරිපාලන පහසුව සඳහා මෙහෙවර පියෙස හෝ කම්කරු මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ භාවිතා නොකරන පරිශ්‍රයක ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

4. යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තිය (i) (ඊ) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියෙකු සහ ගණන්දීමේ නිලධාරියකුගේ වගකීම් යටතේ අභ්‍යන්තර විගණන කාර්යය හා කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට සහතික විය යුතු වුවත් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර වසර කිහිපයක් තිස්සේ පුරප්පාඩුව පැවතීමෙන් එම කර්තව්‍ය නිසි පරිදි ඉටුවී නොතිබුණි.

(ආ) 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01-2019 චක්‍රලේඛයේ 5.1.1 වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ විගණන කළමනාකරණ කමිටුවේ කැඳවුම්කරු ප්‍රධාන අභ්‍යන්තර විගණක වශයෙන් විය යුතු වුවද, එකී තනතුර පුරප්පාඩුව පවතින බැවින් එකී චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

එච්.එම්.ද සොයිසා,
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති.
විගණකාධිපති වෙනුවට

04

පරිච්ඡේදය

කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%)ලෙස තත්‍ය නිමැවුම		
	100% -90%	**75% - 89%**	**50% - 74%**
රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචිය		**82%**	
රැකියා ඇබෑර්තු ලියාපදිංචිය	**114%**		
රැකියා අපේක්ෂිතයන් රැකියා ගත කිරීම			**70%**
පාසැල් සිසුන් සඳහා සිදු කරන වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ගණන	**161%**		
ස්වයං රැකියා හා ව්‍යවසාය ආරම්භ කිරීම		**89%**	

05

පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 තිරසර සංවර්ධන අරමුණු සපුරාගැනීමේ කාර්යසාධනය

ඉලක්කය /අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% -49%	50% - 74%	75% - 100%
තිරසර සංවර්ධන අරමුණු 4 - පරිපූර්ණ,සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	ඉලක්කය 4.3. 2030 වන විට සියලුම කාන්තාවන්ට හා පිරිමින්ට ගුණාත්මක වගයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබා ගත හැකි විශ්ව විද්‍යාල අධ්‍යාපනය ද ඇතුලත්ව තාක්ෂණික,වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට හැකි වීම	සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටින සිසුන්ගෙන් 20% කට වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දීම			113%
		උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටින සිසුන්ගෙන් 20% කට වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දීම			82%
		2023 වසර තුල රැකියා අපේක්ෂිතයන් 120,000 ලියාපදිංචි කිරීම			82%
තිරසර සංවර්ධන අරමුණු 8 - සියල්ලන් සඳහාම පෝෂිත,පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය , පූර්ණ ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධන කිරීම	ඉලක්කය 8.5 2030 වන විට ආබාධිත පුද්ගලයන් සහ යෞවනයන් ද ඇතුලත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා	2023 වසර තුල රැකියා ඇබෑර්තු 45,000 ක් ලියාපදිංචි කිරීම.			114%

ඉලක්කය /අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% -49%	50% - 74%	75% - 100%
	ඵලදායි හා සුනිසි රැකියා අවස්ථාවන් ලබා දීම	**2023** වසර තුල රැකියා අපේක්ෂිතයන් **20,000** ක් රැකියාගත කිරීම		**70%**	
		2023 වසර තුල ව්‍යවසායකයින් හා ස්වයංරැකියාලාභීන් **5,000** ක් බිහි කිරීම			**89%**
		2023 වසර තුල රැකියා අපේක්ෂිතයන් **30,000** සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය සිදු කිරීම			**217%**
		2023 වසර තුල රැකියා අපේක්ෂිතයන් **18,000** ක් පුහුණුව සඳහා යොමු කිරීම			**144%**

06

පරිච්ඡේදය

මානව සම්පත්
සංවර්ධනය

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය - 2023.12.31 දිනට

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු **(අතිරික්ත)/
ජ්‍යෙෂ්ඨ	20	12	8
තෘතීයික	5	1	4
ද්විතීයික	624	605	19
ප්‍රාථමික	15	15	0

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟයේ බලපෑම

ඉහත වගුව අනුව, විධායක මට්ටමේ තනතුරු 20 කින් 8 ක් පුරප්පාඩුව පවතින අතර මින් පුරප්පාඩු තනතුරු 06 ක් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරු සඳහා වේ.

A ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වන අප දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ඇති අතර අභ්‍යන්තර විගණකවරයෙක් නොමැති බැවින් සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකු මඟින් එම සේවය ලබාගනී.

තෘතීයික සේවාවේ තනතුරු ලෙස දෙපාර්තමේන්තුව සඳහා අනුමත කර ඇති භාෂා පරිවර්තක, තොරතුරු තාක්ෂණ නිලධාරී සහ සංඛ්‍යා ලේඛන නිලධාරී යන තනතුරු සියල්ලම මේ වන විට පුරප්පාඩුව පවතී.

ද්විතීයික ශ්‍රේණියේ තනතුරු අතරින් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ පුරප්පාඩු 17ක් පවතින අතර සංවර්ධන නිලධාරී සේවයේ පුරප්පාඩු 02 ක් පවතී.

6.3 දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත 2023 වර්ෂයේ ලබාදුන් පුහුණු පිලිබඳ විස්තර

අනු අංකය	විස්තරය	කාලසීමාව	වියදම (රු.)
01	Induction Training Programme	2023 .02.13,14,15	75,000.00
02	Drivers Training	2023.02.28	25,000.00
03	Training on Personal file Management	2023.03.23,24	28,500.00
04	Training on Priliminary investigation	2023.03.22,23	28,500.00
05	Training on Government payroll system	2023.04.19,20,21	54,000.00
06	Training on How to minimize audit problems	2023.03.22,23	15,000.00
07	Internal auditing Programme	2023.04.24,25	22,500.00

08	Public Procurment Programme	2023.06.19,20	28,500.00
09	Final Accounce Programme	2023.03.16,17	52,500.00
10	Tranceport management Programme	2023.06.20	18,000.00
11	National Deploma in careeguidence	2023	1,040,000.00
12	Capacity Buliding Pogramme for HRDA	2023.11.16	78,825.00
13	Training of Salary conversion	2023.02.16,17	9061.00
14	File management Programme	2023.06.22	3250.00
15	Workshop on recruitment of Leave Clark	2023.08.25,26	28,500.00
16	Workshop on scheme of recruitment	2023 10.11,12	9500.00
Total			**1,516,636.00**

07

පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ /අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම්)වාණිජ අත්තිකාරම් ගිණුම්	අදාල නැත		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නැත		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාලනැත		
1.6	වෙනත්	අදාල නැත		
2	**පොත්පත් හා ලේඛණ නඩත්තු කිරීම මු.රෙ.(445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛණ /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛණය යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛණය යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ CIGAS පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛණය යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛණය යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛණය යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානිපාඩු ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛණය යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛණය (GA-N20) යාවත්කාලින කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක්	අනුකූල වේ		

අංකය	අදාළ කර ගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ /අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම			
3.4	2014.05.11 දිනැති අංක 17/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූලවේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134 DMA/2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ (4)40 උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි (3)134 ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමණාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019අනුව අවම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ /අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් අදාල වර්ෂය තුල පවත්වාගෙන තිබීම			
8	**වත්කම් කළමණාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමණාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදි ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පර්ච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදුකිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදි අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග්පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යැම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මුරෙ 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016-12-29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේකයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව බදු	අනුකූල වේ		

අංකය	අදාළ කර ගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ /අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම			
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මුරෙ (1)94 ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළපසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට ඵලඹීම	අනුකූල නොවේ	අවශ්‍ය ප්‍රතිපාදන සලසා නොතිබීම හේතුවන් ලබා දුන් සීමිත ප්‍රතිපාදන ඉක්මවා අත්‍යවශ්‍ය වියදම් දැරීමට සිදුවීම	අත්‍යවශ්‍ය වියදම් සඳහා ඉල්ලුම් කරන ප්‍රතිපාදන ලබා දීම
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූලවීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩිකාලයක සිට පැවත එන හිටිණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල්ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ /අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාල නොවේ		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාල නොවේ		
15.3	මුරෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම.**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ	අනුකූල වේ		

අංකය	අදාළ කර ගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ /අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.			
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**.			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත්කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

9 වන මහල, සෙත්සිරිපාය, දෙවන අදියර, බත්තරමුල්ල.
ටෙලි : 0112187160 (අධ්‍යක්ෂ ජනරාල්), 0112186405 (සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් අංශය)

9ம் மாடி, செத்சிரிபாய (2ம் கட்டம்), பத்தரமுல்லை. இணையத்தளம்:
தொ.இல: 0112187160 (பணிப்பாளர் நாயகம்) 0112186405 (திட்டமிடல் மற்றும் முன்னேற்ற தொழிற்பாடு பிரிவு)

9th Floor, Sethsiripaya stage 2, Battaramulla.
Tp : 0112187160(DG Office) 0112186405 (Planning and Monitoring Unit)
Web: www.dome.gov.lk

PRINTEC | 0112 815 816